# කෘෂිකර්මය

## තේ


පසුගිය වසර තුළදී සුළු පසු බැසීමකට ලක්වුණු තේ නිෂ්පාදනය, දැඩි නියඟය සහ අඩු වූ පොහොර භාවිතය නිසා 1987 වසරෙහි පළමුවන කාර්තුවේදී සැළකිය යුතු ලෙස අඩු වුවද, 1987 වසරෙහි මුළු තේ නිෂ්පාදනය සියයට එකකින් සුළු වශයෙන් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 213.3 ක් විය. පිහිටීම අනුව වන විවිධ වගා බිම් කාණ්ඩවල නිෂ්පාදන ප්‍රගතීන් බොහෝදුරට එකිනෙකට වෙනස් විය. මැදි බිම් තේ නිෂ්පාදනය සුළු වශයෙන් වැඩි වූ අතර, පහත් බිම් තේ නිෂ්පාදනය සියයට 7 කින් වැඩි වී මෙතෙක් වාර්තා වී ඇති ඉහළම මට්ටම වන කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 86.4 ක් විය. 1986 වසරෙහි මුළු නිෂ්පාදනයෙන් සියයට 38 ක් වූ පහත් බිම් තේ නිෂ්පාදනය 1987 දී සියයට 41 ක් විය. නිෂ්පාදනයෙහි මෙම වැඩි වීමේ උපනතියට පදනම් වූයේ 1980 ගණන් ආරම්භයේදී ප්‍රධාන වශයෙන් කුඩා තේ ඉඩම් හිමියන් පහත් බිම් ප්‍රදේශයන්හි නව තේ වගාවන් ආරම්භ කිරීමය. එයට වෙනස්ව උස් බිම් තේ නිෂ්පාදනය 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 73.4 දක්වා සියයට 5 කින් පහත වැටී පිළිවෙලින් තෙවන වසරටත් අඩුවීමක් පෙන්වන ලදී. නිෂ්පාදනයේ මෙම අඩු වීමට වර්ෂයේ මුල් කාලච්ඡේදයේ තේ නිෂ්පාදනය කරන ප්‍රධාන ප්‍රදේශයන් බොහොමයක පැවති නියඟ තත්ත්වය මූලික වශයෙන් හේතු විය.

1987 වසරෙහි සම්ප්‍රදායික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 209 ක් ලෙස ගණන් බලා ඇති අතර, එය පසුගිය වසර හා සසඳන කල සියයට එකක වැඩි වීමක් දක්වීය. සී. ටී. සී. තේ නිෂ්පාදනයද සුළු වශයෙන් සියයට එකකින් පමණ වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.1 ක්වූ අතර, ඇල්. ටී. පී. තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 3.2 දක්වා සියයට 23 කින් සැළකිය යුතු ලෙස අඩු විය. ඇල්. ටී. පී. තේ නිෂ්පාදනය අඩු වීමට, වසර පුරා සම්ප්‍රදායික තේ සඳහා ලැබුණු සාපේක්ෂ සතුටුදායක මිළ ගණන් නිසා සමහර තේ කම්හල් සම්ප්‍රදායික තේ නිෂ්පාදනයට තවදුරටත් නැඹුරු වීම ද යම් ප්‍රමාණයකට හේතු විය.

රාජ්‍ය අංශයේ වතුවල නිෂ්පාදනය අඩු වූ හෙයින්, 1987 වසරේදී තේ නිෂ්පාදනය වැඩි වීමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ පෞද්ගලික අංශයේ ඉහළ නැඟුණු නිෂ්පාදනයයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් (ශ්‍රී.ලං.රා.වැ.සං) සිය වතු වලින් ලබා ගත් දළුවලින් කළ ඒකාබද්ධ නිෂ්පාදනය 1986 දී සමස්ත තේ නිපැයුමෙන් සියයට 60 ක් වූ අතර, 1987 දී එය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 123.2 දක්වා සියයට 3 කින් අඩු වී සමස්ත නිෂ්පාදනයෙන් සියයට 58 ක් විය. මිළදී ගත් අමු දළු වලින් නිපදවූ තේ ප්‍රමාණය අත්හළවිට, ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි තේ නිෂ්පාදනය 1987 දී සියයට 2 කින් අඩු වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 67.7 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි එම තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 55.6 දක්වා සියයට 5 කින් අඩු විය. මෙම අඩු වීමට විශාල වශයෙන් හේතු වූයේ වසරෙහි මුල් භාගයේ පැවති දරුණු නියඟ තත්ත්වයන් සහ මැදි කාලීන ආයෝජන වැඩපිළිවෙල යටතේ නැවත වගා කිරීම් සඳහා විශාල බිම් ප්‍රමාණයක ගස් උදුරා දැමීමය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි මිළදී ගත් දළු වලින් කළ තේ නිෂ්පාදනය 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 12.1 දක්වා සියයට 3 කින් සුළු වශයෙන් අඩු වී ඔවුන්ගේ මුළු නිපැයුමෙන් සියයට 18 ක් විය. එයට වෙනස්ව, ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි මිළදී ගත් දළු වලින් කළ නිෂ්පාදනය සියයට 4 ක වැඩි වීමක් වාර්තා කරමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 5 ක් වූ අතර, එය ජනවසමෙහි මුළු නිෂ්පාදනයෙන් සියයට 7 ක් විය.

1981 න් පසුව පැහැදිලිව දිස්වුණු උපනතිය තවදුරටත් පවත්වා ගනිමින් පෞද්ගලික අංශයේ තේ නිෂ්පාදනය 1987 දීද සියයට 10 කින් වැඩි විය. ජනවසමෙහි සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි කම්හල්වල සකස් කරනු පිණිස පෞද්ගලික අංශය විසින් සැපයූ අමු දළු, පෞද්ගලික අංශය යටතේ වූ නිෂ්පාදනයට ඇතුළත් කළ විට 1986 සමස්ත තේ නිපැයුමෙන් සියයට 39 ක් වූ පෞද්ගලික අංශයෙහි නිෂ්පාදනයට හිමි වූ කොටස 1987 දී සියයට 42 දක්වා වැඩි විය.

# ප්‍රධාන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

තේ වගා අංශය සඳහා නිකුත් කරන ලද මුළු පොහොර ප්‍රමාණය 1987 දී සියයට 6 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 136,335 ක් විය. මෙම වැඩි වීම 1987 වසරෙහි දෙවන භාගයට බොහෝදුරට සීමා වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ යහපත් කාලගුණික තත්ත්වයන් සහ වඩා හොඳ තේ මිළ ගණන්ය. එසේ වුවද, ජනවසම මගින් පාලනය වූ වතුවල පොහොර භාවිතය 1987 දී මෙට්‍රික් ටොන් 39,709 ක් දක්වා සියයට 4 කින් පහත වැටුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි වතුවල පොහොර භාවිතය 1986 දී මෙට්‍රික් ටොන් 34,595 සිට 1987 දී මෙට්‍රික් ටොන් 30,808 දක්වා සියයට 11 කින් සැළකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, ලැබී තිබෙන දත්තයනට අනුව 1987 වසරෙහි පෞද්ගලික අංශයට අයිති තේ වතුවල පොහොර භාවිතයේ වැඩි වීමක් පෙන්නුම් කරයි. වසරෙහි පළමු කාර්තුව තුළ පහත් බිම් ප්‍රදේශවල පැවති නියඟය අනෙකුත් බිම් කාණ්ඩවල පැවති නියඟය තරම් දැඩි නොවීම නිසා පැහැදිලිවම මෙම වැඩි වීම විශාල වශයෙන් පහත් බිම් ප්‍රදේශවලට සීමා විය.

### 1 . 10 සංඛ්‍යා සටහන
### තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1985 – 1987

| ශීර්ෂය | ඒකකය | 1985 | 1986(අ) | 1987(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 214·1 | 211·3 | 213·3 |
| 1.1 උස් බිම් .. | ,, | 78·9 | 77·1 | 73·4 |
| 1.2 මැදි බිම් .. | ,, | 55·1 | 53·3 | 53·5 |
| 1.3 පහත් බිම් .. | ,, | 80·1 | 80·9 | 86·4 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 231 | 223 | 221 |
| 3. පොහොර නිකුතුව .. | මෙට්‍රික් ටොන් දහස් | 149·9 | 128·8 | 136·3 |
| 4. නැවත වගා කිරීම .. | හෙක්ටයාර | 1,672 | 1,618 | 1,503 |
| 5. මිළ .. | | | | |
| 5.1 කොළඹ (ශුද්ධ) .. | කි. ග්‍රෑ./රුපියල් | 35·39 | 30·28 | 38·06 |
| 5.2 අපනයන (නැ.වි.ස.) .. | ,, | 60·62 | 44·52 | 52·97 |
| 6. නිෂ්පාදන වියදම .. | ,, | 35·00 | ලැ.නො. | ලැ.නො. |
| 7. අපනයන .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 198·0 | 207·8 | 201·1 |
| 8. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ | 12,002·8 | 9,252·8 | 10,653·5 |
| | (විගැහි දශ ලක්ෂ) | (434) | (281) | (280) |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) .. | | 5·6 | 4·5 | 5·5 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

සැළකිය යුතුයි : හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව පිළිබඳ දත්ත ලැබී නැත.

සමස්තයක් වශයෙන් මුළු රටටම අදාළ වූ සාමාන්‍ය ඵලදාව පිළිබඳ තොරතුරු ලැබී නොමැත. 1987 දී ජනවසම මගින් පාලනය වූ වතුවල සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,249 දක්වා සියයට එකකින් සුළු වශයෙන් වැඩිවුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,142 දක්වා සියයට 2 කින් සුළු වශයෙන් පහත වැටුණි. පෞද්ගලික අංශයෙහි සාමාන්‍ය ඵලදාව සම්බන්ධයෙන් අදාළ දත්තයන් ලැබී නොමැති වුවද, කලින් සඳහන් කළ පරිදි පෞද්ගලික අංශයෙහි තේ වගා කළ බිම්වල නිෂ්පාදනයේ සියයට 10 ක වැඩි වීම පදනම් කර, 1987 වසරෙහිදී පෞද්ගලික අංශයේ තේ බිම්වල සාමාන්‍ය ඵලදාව වැඩි වී යැයි පහසුවෙන් උපකල්පනය කිරීමට පුළුවන.

තේ වගාව යටතේ ලියාපදිංචි කළ මුළු බිම් ප්‍රමාණය පිළිවෙලින් දෙවැනි වසරටත් අඩු වී, සියයට එකක පහත වැටීමක් වාර්තා කරමින් හෙක්ටයාර 221,498 ක් විය. බිම් ප්‍රමාණය අඩු වීමට මුළුමනින්ම දයක වූයේ රාජ්‍ය අංශයයි. ජනවසම මෙන්ම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි

සංස්ථාවන් යටතේ පැවති තේ බිම් ප්‍රමාණය සියයට 2 බැගින් අඩුවී පිළිවෙලින් හෙක්ටයාර 58,744 ක් සහ හෙක්ටයාර 54,370 ක් විය. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සමහර වතු මුල් අයිතිකරුවනට පවරා දීම සහ ආන්තික තේ ඉඩම් වෙනත් කටයුතු සඳහා පවරා දීමත්ය. පෞද්ගලික අංශයේ තේ බිම් ප්‍රමාණය සියයට එකක වැඩි වීමක් වාර්තා කළ ද, රාජ්‍ය අංශයෙහි බිම් ප්‍රමාණය අඩු වීම හිලව් කිරීමට එය ප්‍රමාණවත් නොවීය. ජනවසමට අයත් තේ දළු නෙලා ගන්නා බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 55,858 සිට 1987 දී හෙක්ටයාර 54,156 දක්වා සියයට 3 කින් අඩු වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි දළු නෙලා ගන්නා බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 49,760 සිට 1987 දී හෙක්ටයාර 48,663 දක්වා සියයට 2 කින් පහත වැටුණි.

1987 වසර තුළ නැවත වගා කරන ලද මුළු තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,503 ක් වූ අතර, එය පසුගිය වසරෙහි නැවත වගා කරන ලද බිම් ප්‍රමාණයට (හෙක්ටයාර 1,618) වඩා සියයට 7 කින් අඩු විය. ජනවසමෙහි නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 553 සිට 1987 දී හෙක්ටයාර 493 දක්වා හෙක්ටයාර 60 කින් පහත වැටුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 602 සිට 1987 දී හෙක්ටයාර 661 දක්වා හෙක්ටයාර 59 කින් වැඩි විණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ලැබී ඇති දත්තයන්ට අනුව සහනාධාර ලැබ පෞද්ගලික අංශය විසින් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 463 සිට 1987 දී හෙක්ටයාර 349 දක්වා අඩු විය. මෙම දුර්වල ක්‍රියාකාරිත්වයට තරමක් දුරට හේතු වූයේ වසර මුල් භාගයේ පැවති අසතුටුදායක කාලගුණික තත්ත්වයන්ය.

අළුතින් තේ වගා කිරීම් 1986 දී දෙගුණයකින් පමණ වැඩි වී හෙක්ටයාර 1,633 ක් වුවද, 1987 දී එය සියයට 12 කින් අඩු වී හෙක්ටයාර 1,437 ක් විය. පසුගිය වසර සමඟ සසඳා බලන කල පෞද්ගලික අංශයේ අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 246 කින් අඩු වූ අතර, ජනවසමෙහි සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි අළුතින් වගා කළ බිම් ප්‍රමාණය එක්ව ගත් කල හෙක්ටයාර 50 ක වැඩි වීමක් වාර්තා කරන ලදී. පසුගිය වසරෙහි පැවති සාපේක්ෂ පහත් මිළ ගණන් පෞද්ගලික අංශයෙහි අළුතින් වගා කිරීම් කෙරෙහි පසුකාලීන අහිතකර බලපෑම් ඇති කළා විය හැක.

නැවත වගාවන් සහ අළුතින් වගාවන් සඳහා දෙනු ලබන සහනාධාර අනුපාතිකයන් වසර තුළ නොවෙනස්ව පැවතිණ. එහෙත් දැනට පවත්නා මෙම සහනාධාර අනුපාතිකයන් වගාවන් සඳහා වැය වන මුළු පිරිවැයෙන් කොටසක් පමණක් පියවීමට ප්‍රමාණවත් වූ හෙයින් පෞද්ගලික අංශයෙහි නැවත වගා සහ නව වගා කටයුතු සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීමට දිරි ගැන්වීමෙහි අපොහොසත් විය. නැවත වගාවන් සම්බන්ධයෙන් ගත් කල සහනාධාර අනුපාතිකයන් ඒ සඳහා වැය වන වියදමින් අඩක් පමණ පියවීමට ප්‍රමාණවත් වේ. තේ අළුතින් වගා කිරීම සඳහා යොදා ගතහැකි ඉඩම්වල හිඟකම ගැන සළකා බලන කල, තේ නිෂ්පාදනයෙහි වැඩි වීම දැනටමත් තේ වගාව යටතේ ඇති බිම් ප්‍රමාණයේ ඵලදායිතාවය වැඩි කිරීම මත බොහෝදුරට රඳාපවතිනු ඇත. එහෙයින් නැවත වගා කටයුතුවල යෙදෙන වගා කරුවනට නොකඩවා මෙන්ම ක්‍රමානුකූලව නැවත වගා කිරීම සහතික කරනු වස් ප්‍රමාණවත් දිරි ගැන්වීම් ලබාදීම ඉතාමත් වැදගත් වේ.

රාජ්‍ය අංශයේ වතුවල නිෂ්පාදනය කළ තේ කිලෝ ග්‍රෑමයක බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම රුපියල් 38.38 ක් වශයෙන් ගණන් බලා ඇති අතර, එය පසුගිය වසරට වඩා සියයට 5 ක වැඩි වීමක් දක්වයි. වැටුප් වියදම වැඩි වීම සහ රටෙහි පැවති අස්ථාවර තත්ත්වයන් නිසා පොදු කාර්ය වියදම් ඉහළ යාම මෙයට බොහෝදුරට හේතු වන්නට ඇත. ජනවසමෙහි නිෂ්පාදන වියදම කිලෝ ග්‍රෑමයකට රුපියල් 39.50 දක්වා සියයට 3 කින් වැඩි වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදන වියදම කිලෝ ග්‍රෑමයකට රුපියල් 37.20 දක්වා සියයට

8 කින් වැඩි විය. කොළඹ වෙන්දේසියේ සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිළ 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 30.28 සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 38.06 දක්වා සියයට 26 කින් වැඩි විය. ජනවසමෙහි නිෂ්පාදන ආන්තිකයන් 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 8.04 ක අලාභයක සිට 1987 දී රුපියල් 3.38 ක අලාභයක් දක්වා අඩු විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදන ආන්තිකය 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 2.45 ක අලාභයක සිට 1987 දී රුපියල් 1.07 ක ලාභයක් දක්වා වෙනස් විය.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පෞද්ගලික අංශයේ තේ වගා කරුවන් සඳහා නොයෙක් අයුරින් ආධාර කිරීමෙහි නොකඩවා නිරත විය. සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වේ. මීට අමතරව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කුඩා තේ ඉඩම් හිමියන්ගේ අමු තේ දළු සකස් කිරීම සඳහා කර්මාන්තශාලා ගණනාවක් පවත්වාගෙන යනු ලැබේ. පසුගිය වසරේදී මෙන්ම 1987 වසරෙහිදී ද මෙම කර්මාන්තශාලා ගණන 12 ක් විය.

අපනයන දිරි ගැන්වීමක් වශයෙන් තොග තේ, පැකට් කළ තේ, ක්ෂණික තේ සහ හරිත තේ සඳහා වූ අපනයන බදු 1987 නොවැම්බර් මාසයේදී පිළිවෙලින් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 3.50, රුපියල් 2.00, රුපියල් 8.50 සහ රුපියල් 3.50 දක්වා කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.50 කින් අඩු කරන ලද අතර, මලුවල ඇසුරු තේ සඳහා වූ අපනයන බද්ද අවලංගු කරන ලදී. පහත් තත්ත්වයේ තේ අපනයන කිරීම වැළැක්වීම සඳහා වසර තුළදී කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කරන තේ සඳහා තේ මණ්ඩලය විසින් අවම තත්ත්ව ප්‍රමිතීන් හඳුන්වා දෙන ලදී. මේ පියවර මහින් මිළ ගණන් කෙරෙහි ද සතුටුදායක බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

වර්ෂය තුළදී කොළඹ වෙන්දේසියේ සියළුම තේ සඳහා වූ සාමාන්‍ය මිළ ගණන් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 34 ට වඩා වැඩිව පැවති හෙයින් 1987 දී තේ ස්ථායීකරණ අරමුදලින් තේ වගා කරුවනට ආධාර දෙනු නොලැබිණ.

**රබර්**

කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 123 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇති 1987 වසරේ රබර් නිෂ්පාදනය ඉකුත් වසරේ නිෂ්පාදනයට වඩා සියයට 11 ක අඩු වීමක් දැක්විය. මෙය පසුගිය දශක දෙක තුළ වාර්තා වූ අඩුම නිෂ්පාදන මට්ටම විය. දැඩි නියඟ තත්ත්වයන් නිසා වර්ෂයේ පළමුවන කාර්තුව තුළ අඩු වූ නිෂ්පාදනය, රබර් නිපදවන ප්‍රධාන ප්‍රදේශවල පැවති තද වැසි නිසා රබර් කිරි කැපීම අඩු වීමේ හේතුවෙන් තුන්වන කාර්තුව තුළදී තවදුරටත් පහත වැටිණ. එසේම නැවත වගා කිරීමේ කටයුතු සඳහා විශාල භූමි ප්‍රමාණයක රබර් ගස් උදුරා දැමීමද, වසරෙහි රබර් නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී.

නිෂ්පාදනය අඩු වීමට රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය විසින් එකිනෙකට වෙනස් ලෙස දයක විය. පසුව සඳහන් කරන ලද අංශයේ නිෂ්පාදනයේ අඩු වීම මුළු නිෂ්පාදනයේ අඩු වීම වූ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 14.8 න් සියයට 84 ක් පමණ විය. 1987 වසර තුළ පෞද්ගලික අංශයේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 83.4 ක් ලෙස ගණන් බලා ඇති අතර එය පසුගිය වසර සමඟ සසඳන කල සියයට 13 ක අඩු වීමකි.

මිළදී ගන්නා ලද රබර් කිරිවලින් කරන ලද නිෂ්පාදනය අත් හළ පසු ජනවසමේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඒකාබද්ධ රබර් නිෂ්පාදනය 1986 කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 40.4 සිට 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 38.6 දක්වා කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.8 කින් හෙවත් සියයට 4 කින් පමණ අඩු විය. ජනවසමෙහි නිෂ්පාදනය සියයට 4 කින් පහත වැටුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදනය සියයට 5 කින් අඩු විය. (මිළදී ගත් රබර් කිරි වලින් කළ නිෂ්පාදනය අත්හැර)

රබර් පාලන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද දත්තයන්ට අනුව පසුගිය වසර සමඟ සසඳන කල 1987 වසරේ සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 744 දක්වා සියයට 10 කින් පහත වැටුණි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි සාමාන්‍ය ඵලදාව සියයට 5 ක අඩු වීමක් වාර්තා කරන ලද අතර, ජනවසමෙහි සාමාන්‍ය ඵලදාව සියයට 3 කින් අඩු විය.

පසුගිය වර්ෂවලදී මෙන්ම, අඩු ඵලදාවක් ඇති රබර් ඉඩම්වල විශේෂයෙන් තේ වගා කිරීම සහ රබර් ඉඩම් සංවර්ධන වැඩ කටයුතු සඳහා එළි පෙහෙළි කිරීමේ උපනතිය 1987 වසරේදී ද අඛණ්ඩව සිදුවිය. මෙය රබර් වගාව යටතේ ලියාපදිංචි කරන ලද මුළු බිම් ප්‍රමාණයෙහි සුළු අඩු වීමකට හේතු විය. 1987 වසරේදී කිරි කපනු ලබන බිම් ප්‍රමාණය සියයට එකකින් අඩු වී මෑත අතීතයේ වාර්තා වූ අවම මට්ටම වන හෙක්ටයාර 165,565 ක් විය. කිරි කපනු ලබන බිම් ප්‍රමාණයේ මෙම අඩු වීමේ උපනතිය 1980 සිටම දක්නට ලැබිණ.

## 1.11 සංඛ්‍යා සටහන

### රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1985 – 1987

| ශීර්ෂය | ඒකකය | 1985 | 1986 (අ) | 1987 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කි. ග්‍රෑ. දශ ලක්ෂ | 137·5 | 137·8 | 123·0 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2·1 වගාව යටතේ ඇති .. | හෙක්ටයාර දහස් | 205·5 | 205·2 | 205·1 |
| 2·2 කිරි කැපීම යටතේ ඇති .. | ,, | 168·2 | 166·7 | 165·6 |
| 3. ඵලදාව | හෙක්ටයාරයකට කි. ග්‍රෑ. | 818 | 826 | 744 |
| 4. පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් | 24·2 | 26·3 | 24·7 |
| 5. නැවත වගා කිරීම | හෙක්ටයාර | 6,694 | 5,911 | 5,512 |
| 6. මිළ | | | | |
| 6.1 අපනයන (නැ. වි. ස.) .. | කි. ග්‍රෑ./රුපියල් | 21·34 | 23·83 | 27·63 |
| 6.2 කොළඹ ආර්. එස්. එස්. නො. 1 .. | ,, | 15·90 | 16·62 | 21·10 |
| 7. නිෂ්පාදන වියදම (ඇ) .. | ,, | 10·50 | 10·93 | 11·37 |
| 8. අපනයන .. | කි. ග්‍රෑ. දශ ලක්ෂ | 120·2 | 110·0 | 106·0 |
| 9. දේශීය පරිභෝජනය .. | ,, | 15·1 | 16·4 | 18·0 |
| 10. අපනයන ඉපැයීම් .. | රු. දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ) | 2,566·0 ( 93) | 2,622·0 (80) | 2,929·3 (77) |
| 11. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) .. | | 1·4 | 1·4 | 1·4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) පෞද්ගලික අංශයේ වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඈ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : රබර් පාලන දෙපාර්තමේන්තුව; ජාතික පොහොර ලේකම් කාර්යාලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 දී රබර් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 24,706 දක්වා සියයට 6 කින් අඩු විය. මෙයට අයහපත් කාලගුණික තත්ත්වයන් මෙන්ම නැවත වගාවන් සහ අළුත් වගාවන් කරන ලද මුළු බිම් ප්‍රමාණයෙහි අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වසර සමඟ සසඳන කල ජනවසම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මඟින් පාලනය වන රබර් වතුවල පොහොර භාවිතය 1987 දී පිළිවෙලින් සියයට 5 කින් හා සියයට 2 කින් අඩු විය. පසුගිය වසර 7 පුරා පැවති උපනතිය වෙනස් කරමින් 1987 දී පෞද්ගලික අංශයේ බිම්වල පොහොර භාවිතයද සියයට 8 කින් සැළකිය යුතු ලෙස අඩු විය.

රබර් පාලන දෙපාර්තමේන්තුවේ තාවකාලික දත්තයනට අනුව නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය 1986 දී හෙක්ටයාර 5,911 සිට 1987 දී හෙක්ටයාර 5,512 දක්වා සියයට 7 කින් අඩු විය. ජනවසම මඟින් පාලනය වන වතුවල නැවත වගා කළ බිම් ප්‍රමාණය 1987 දී

හෙක්ටයාර 796 දක්වා සියයට 8 කින් අඩුවූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුවල මෙම ප්‍රමාණය 1987 දී හෙක්ටයාර 1,224 දක්වා සියයට 11 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. පෞද්ගලික අංශයේ වතුවල නැවත වගා කිරීම් සියයට 12 කින් සැළකිය යුතු ලෙස අඩු වී හෙක්ටයාර 3,492 ක් විය. මෙය වසර පුරා ෂීට් රබර් සඳහා පැවති ඉහළ මිළ ගණන් නිසා කුඩා ඉඩම් හිමියන් නැවත වගා කිරීමට මැලි වීම පිළිබිඹු කරන ලදී. ‘ කොරිනස්පෝරා පත්‍ර පුල්ලි ’ රෝගයට අඩුවෙන් ගොදුරු වන රබර් පැල අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීමට තිබූ අපහසුතාවයද, 1987 වසරෙහි නැවත වගා කිරීමේ කටයුතුවලට බලපෑමක් ඇති කරන ලදී. ලෝක බැංකු ආධාර මත කුඩා රබර් ඉඩම් හිමියන් පුනරුත්ථාපනය කිරීමේ වැඩපිළිවෙල කෑගල්ල, කළුතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක සඳහා 1987 වසරෙහිදීද ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය යටතේ 1987 වර්ෂය තුළදී හෙක්ටයාර 2,749 ක් නැවත වගා කළ අතර, 1987 වසර අවසානය වනවිට මේ ව්‍යාපෘතිය යටතේ නැවත වගා කරන ලද සමුච්චිත බිම් ප්‍රමාණය හෙක්ටයාර 19,924 ක් විය.

1986 දී සියයට 33 කින් අඩු වූ අළුතින් රබර් වගා කරන ලද බිම් ප්‍රමාණය 1987 දී තවදුරටත් සියයට 14 කින් අඩු වී හෙක්ටයාර 1,460 ක් විය. මෙම අඩු වීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි සහ පෞද්ගලික අංශයේ දක්නට ලැබිණ. ජනවසමෙහි අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 20 ක වැඩි වීමක් දැක්වීය. රබර් වගා කරන බොහෝ ප්‍රදේශවල දීර්ඝ කාලයක් පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් මෙම අඩු වීමට හේතු වූවා විය හැකිය. මෙම අයහපත් කාලගුණික තත්ත්වයනට අමතරව, තවදුරටත් රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා සුදුසු ඉඩම් හිඟකමද 1987 අළුතින් රබර් වගා කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී.

1987 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ වතුවල මෙන්ම පෞද්ගලික අංශයේ වගා කරුවන්ගේද රබර් නිෂ්පාදන පිරිවැය වැඩි විය. පෞද්ගලික අංශය ගත් කල එහි නිෂ්පාදන පිරිවැය 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.93 සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 11.37 දක්වා සියයට 4 කින් වැඩි වී යැයි ගණන් බලා ඇත. ජනවසමෙහි නිෂ්පාදන පිරිවැය 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 18.45 සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 20.92 දක්වා සියයට 13 කින් සැළකිය යුතු වැඩි වීමක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදන පිරිවැය 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 18.30 සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 18.74 දක්වා සියයට 2 කින් සුළු වශයෙන් වැඩි විය.

1987 වර්ෂය තුළදී ජාත්‍යන්තර වෙළෙඳපොලවල ස්වාභාවික රබර් මිළ ගණන්වල සුළු මිළ උත්පාතයක් දක්නට ලැබිණ. 1986 දී සියයට 12 කින් වැඩි වී රුපියල් 23.83 ක් වූ රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිළ (නැ. වි. ස.) 1987 දී සියයට 16 කින් සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී කිලෝ ග්‍රෑමයක් රුපියල් 27.63 ක් විය. මෙය මෑත අතීතයේ වාර්තා වූ ඉහළම මිළ මට්ටමය. පසුගිය වසර හා සසඳන කල 1987 දී කොළඹ වෙන්දේසියෙහිදී සියළුම ෂීට් රබර් වර්ග සහ ස්ක්‍රැප් ක්‍රේප් රබර් සඳහා ලැබුණ සාමාන්‍ය මිළ ගණන් සැළකිය යුතු වැඩි වීමක් වාර්තා කළ අතර, ලේටෙක්ස් ක්‍රේප් මිළ ගණන් සැළකිය යුතු ලෙස පහත වැටුණි. 1987 වසරේදී කොළඹ වෙන්දේසියෙහි දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් වූයේ ෂීට් රබර් සඳහා ලැබුණ වාර්තාගත මිළ ගණන්ය. මේ සඳහා බලපාන ලද මූලික හේතූන් වූයේ අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා දේශීය සැපයුම අඩු වීමත්, පාරිභෝගිකයන් සතු තොග අඩු වීම, දියුණු රටවල මෝටර් රථ හා ටයර් කර්මාන්තයන්හි ඇති වූ ප්‍රගතිය සහ මැලේසියාව, තායිලන්තය හා ඉන්දුනීසියාව යන ප්‍රධාන රබර් නිෂ්පාදනය කරන රටවල එම කාලයෙහි අඩු වූ නිෂ්පාදනය නිසා ඇති වූ ප්‍රබල ඉල්ලුමත්‍ය. කොළඹ වෙන්දේසියේ 1987 දී දක්නට ලැබුණු අනෙක් විශේෂ ලක්ෂණය වූයේ අව ශ්‍රේණිවල රබර් සඳහා දේශීය රබර් භාණ්ඩ නිෂ්පාදකයින්-ගෙන් සහ අපනයනය කරන්නන්ගෙන් ඇතිවූ ප්‍රබල ඉල්ලුමය. කුඩා රබර් ඉඩම් හිමියන් වැඩි වුණු ෂීට් රබර් මිළ ගණන්වල වාසිය ලැබුවද, අඩු වූ ක්‍රේප් රබර් මිළ ගණන් රාජ්‍ය අංශයේ වතු වල නිෂ්පාදන ආන්තිකයන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී. ජනවසමෙහි

නිෂ්පාදන ආන්තිකයන් 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 3.36 ක ලාභයක සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට ශත 53 ක අලාභයක් දක්වා අඩු විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදන ආන්තිකයන් 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 2.98 ක ලාභයක සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.17 ක ලාභයක් දක්වා අඩු විය.

දේශීය රබර් පරිභෝජනය 1986 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 16.4 සිට 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 18 දක්වා සියයට 10 කින් සැළකිය යුතු ලෙස අඩු වූ අතර, එය මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 15 ක් විය. වසර පුරාම කොළඹ වෙන්දේසියේදී දේශීය පාරිභෝගිකයන්ගෙන් පහත් ශ්‍රේණිවල රබර් වර්ග සඳහා ඉතා හොඳ ඉල්ලුමක් පැවතීමේ හේතුවෙන් තත්ත්වයෙන් බාල රබර්වල මිළ ගණන් වැඩි විය.

වසර තුළ රබර් වගා අංශයේ විවිධ වගා කටයුතු සඳහා දෙන ලද සහනාධාර වෙනස් නොවී පැවතිණි. ' කොරිනස්පෝරා පත්‍ර පුල්ලි ' රෝගය රබර් නැවත වගා කිරීම් සහ අළුතින් වගා කිරීමේ සහනාධාර ක්‍රම යටතේ වගා කරන ලද ආර්. ආර්. අයි. සී. 103 රබර් පැලවලට විශේෂයෙන් අහිතකර ලෙස බලපාන ලදී. මෙම රෝගය ප්‍රධාන වශයෙන් අවිස්සාවේල්ල, රත්නපුරය, ගාල්ල සහ කළුතර යන ප්‍රදේශයන්හි දක්නට ලැබිණි. වසර තුළදී පෞද්ගලික අංශය සතු වූ රබර් ඉඩම්වලින් හෙක්ටයාර 872 ක වූ රබර් ගස් මෙම රෝගයට ගොදුරු වීම නිසා උදුරා දැමූ අතර, හෙක්ටයාර 364 ක රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති රබර් පැල නැවත වගා කරන ලදී.

අපනයනය කරන සෑම රබර් කිලෝ ග්‍රෑමයකටම ගෙවිය යුතු මුළු සෙස් බද්ද රුපියල් 1.46 කරමින් රබර් පර්යේෂණ සෙස් බද්ද 1987 නොවැම්බර් මාසයේදී කිලෝ ග්‍රෑමයකට ශත 10 සිට ශත 25 දක්වා වැඩි කරන ලදී.

**පොල්**

කාලගුණය මත බොහෝදුරට රඳී තිබෙන පොල් නිෂ්පාදනය 1986 වසරේදී ගෙඩි දශ ලක්ෂ 3,039 ක වාර්තාගත වැඩි වීමක් පෙන්නුම් කළ අතර, එය 1987 දී ගෙඩි දශ ලක්ෂ 2,292 දක්වා සියයට 25 කින් සැළකිය යුතු අඩු වීමක් වාර්තා කරමින් තියුණු පසුබෑමකට ලක්විය. පසුගිය වසරේ අදළ කාලච්ඡේදයන් හා සසඳන කල 1987 ප්‍රථම භාගයේ නිෂ්පාදනය සියයට 19 කින් අඩු වූ අතර, දෙවන භාගයේ නිෂ්පාදනය සියයට 30 කින් පහත වැටුණි. 1986 සහ 1987 වර්ෂයන්හි දී දිගු කාලයක් පැවති නියඟයෙහි බලපෑම නිෂ්පාදනයේ තියුණු පහත වැටීම තුළින් විශාල වශයෙන් පිළිබිඹු විය. තවද, 1985 දී සහ 1986 වර්ෂයේ මුල් කාලච්ඡේදයේදී පැවති පහත් පොල් මිළ ගණන් හේතුවෙන් එම වර්ෂයන්හි පොහොර භාවිතය අඩුවීම, නිෂ්පාදනය කෙරෙහි පසු කාලීන අහිතකර බලපෑමක් ඇති කරන ලදී.

පොල් ගෙඩි නිෂ්පාදනයේ තියුණු පහත වැටීම වර්ෂය තුළදී පොල් තෙල් සහ කපාපු පොල් යන නිෂ්පාදනයන් දෙකට අහිතකර ලෙස බලපාන ලදී. එමනිසා 1987 වර්ෂය තුළදී පොල් තෙල් නිෂ්පාදනය සහ කපාපු පොල් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 50 කින් සහ සියයට 18 කින් අඩු වීය. 1986 සමඟ සසඳන විට 1987 වර්ෂයේදී කොප්පරා සහ පොල් ගෙඩි අපනයන පිළිවෙලින් සියයට 8 කින් සහ සියයට 11 කින් පහත වැටුණි.

1987 වර්ෂයේදී පොල් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 34 කින් වැඩි වෙමින් මෙට්‍රික් ටොන් 42,178 ක් විය. පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශවල සාපේක්ෂව පැවති යහපත් කාලගුණික තත්ත්වයන් සහ පොල් ගෙඩි සඳහා වූ මිළ ගණන්වල සැළකිය යුතු වැඩි වීමත් සමඟම වර්ෂයේ දෙවන භාගයේදී පොහොර භාවිතයේ වැඩි වීම ඉතා පැහැදිලි විය. රජයට අයිති වාණිජ බැංකු වන ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන පොල් පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය සංඛ්‍යාවෙහි සුළු

වැඩි වීමක් වාර්තා කරන ලදී. 1987 වර්ෂය තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.3 ක් වූ අතර, එය 1986 වර්ෂයේදී දෙන ලද ණය ප්‍රමාණයට ආසන්න වශයෙන් සමාන විය.

1987 වර්ෂයේ මුල් කාලච්ඡේදයේදී දක්නට ලැබුණු දැඩි නියඟ තත්ත්වයන් විවිධ සහනාධාර යෝජනා ක්‍රමයන්ගේ ප්‍රගතිය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. පුනරුත්ථාපනය කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 6,383 දක්වා සියයට 16 කින් අඩු විය. එයට වෙනස්ව යමින්, පුනරුත්ථාපනය සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17 දක්වා සියයට 44 කින් වැඩි විය. විශේෂයෙන් යෙදවුම් බෙදා හැරීම හා සම්බන්ධ වන පහසුකම් සේවා පුළුල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහනාධාරයන්ගේ දෙවන සහ තුන් වන වාරිකයන් ලබා ගැනීමට වගා කරුවන් විසින් දක්වන ලද උනන්දුව මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**1 . 12 සංඛ්‍යා සටහන**

**පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1985 – 1987**

| ශීර්ෂය | ඒකකය | 1985 | 1986 | 1987 (අ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ආ) .. | ගෙඩි දශ ලක්ෂ | 2,958 | 3,039 | 2,292 |
| 1·1 කපාපු පොල් .. | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 362 | 428 | 350 |
| 1·2 පොල් තෙල් .. | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 1,038 | 1,146 | 573 |
| 1·3 කොප්පරා (ඈ) .. | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 37 | 48 | 44 |
| 1·4 පොල් ගෙඩි අපනයන .. | ගෙඩි දශ ලක්ෂ | 10 | 18 | 16 |
| 1·5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඉ) | ,, | 1,425 | 1,451 | 1,368 |
| 2. සාමාන්‍ය මිළ | | | | |
| 2·1 කොළඹ .. | ගෙඩිය/රුපියල් | 2·18 | 1·83 | 3·29 |
| 2·2 අපනයන (නැ. වි. ස.) .. | ,, | 2·63 | 1·57 | 2·80 |
| 3. පොහොර නිකුතුව .. | මෙ. ටොන් දහස් | 41·0 | 31·6 | 42·2 |
| 4. නිෂ්පාදන වියදම .. | ගෙඩිය/රුපියල් | 0·64 | 0·66 | 0·62 |
| 5. නැවත වගාව/යටි වගාව (ඊ) .. | හෙක්ටයාර | 4,102 | 4,206 | 2,922 |
| 6. නව වගාව (ඊ) .. | ,, | 1,561 | 1,465 | 1,850 |
| 7. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ | 3,093 | 2,389 | 2,140 |
| | (විගැහි දශ ලක්ෂ) | (112) | (73) | (56) |
| 7·1 මද නිෂ්පාදනයන් .. | රුපියල් දශ ලක්ෂ | 2,383 | 1,609 | 1,423 |
| | (විගැහි දශ ලක්ෂ) | (86) | (49) | (37) |
| 7·2 අනෙකුත් නිෂ්පාදන .. | රුපියල් දශ ලක්ෂ | 710 | 780 | 717 |
| | (විගැහි දශ ලක්ෂ) | (26) | (24) | (19) |
| 8. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (උ) .. | | 3·3 | 2·6 | 2·6 |

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය;
පොල් සංවර්ධන අධිකාරිය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම් සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ).

(ඇ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදගත් අනුපාතිකයන් :
කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925

(ඈ) අපනයන පමණි.

(ඉ) ඒක පුද්ගල ගෘහ පරිභෝජනය වසරකට ගෙඩි 90 ක් ලෙස ගණන් බලා ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(ඊ) විස්තරාත්මක තොරතුරු ලබාගත නොහැකි බැවින් හෙක්ටයාර 0·4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

(උ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

1987 වර්ෂයේදී යටි වගා සහ නැවත වගා යටතේ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,922 දක්වා සියයට 31 කින් පහත වැටුණු අතර, ඒ සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 16.6 දක්වා සියයට 18 කින් අඩු විය. එයට වෙනස්ව යමින් අළුතින් පොල් වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර 0.4 ට අඩු කුඩා ඉඩම් හැර) හෙක්ටයාර 1,850 දක්වා සියයට 26 කින් ඉහළ නැගුණි. මෙම අරමුණ සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15.3 දක්වා සියයට 16 කින් වැඩි විය. පොල් ඉඩම්වල අතුරු වගාවන් ලෙස තෘණ, ගම්මිරිස්, කෝපි සහ කොකෝවා වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 40 කින්, සියයට 12 කින්, සියයට 36 කින් සහ සියයට 53 කින් පහත වැටුණි.

1987 වසරේදී ප්‍රධාන පොල් නිෂ්පාදිතයන් තුන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි පැවති මිළ ගණන් සැලකිය යුතු පරිදි යහපත් විය. ප්‍රබල ඉල්ලුම, ආනයන කරුවන් හා නිෂ්පාදකයින් වෙත වූ අඩු තොග ප්‍රමාණයන් සහ විශේෂයෙන් දිගුකාලයක පැවැති නියඟය සහ සුළි සුළං අහිතකර ලෙස බලපාන ලද පිලිපීනය ඇතුළු අග්නිදිග ආසියානු රටවල සැපයුම පහත වැටීමත් යන සාධකයන් මෙයට හේතු විය. කෙසේ වුවද, නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීම සහ ඒ සමඟ දේශීය මිළ ගණන් ඉහළ යාම, අපනයනය කළ හැකි සැපයුම් අතිරික්තය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිකළ හෙයින් ජාත්‍යන්තර මිළ ගණන් විශාල වශයෙන් වැඩි වීමේ උපරිම ඵල නෙලා ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් විය. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙහි ගෙඩි සමානය 1987 දී ගෙඩි දශ ලක්ෂ 538 දක්වා සියයට 51 කින් පහත වැටුණි.

1987 දී පොල් ගෙඩි මිළ ගණන් සැළකිය යුතු ලෙස වැඩිවීමෙන් නිෂ්පාදකයිනට වාසි සැලසුණි. කොළඹ වෙළෙඳපලෙහි පොල් ගෙඩියක් සඳහා වූ සාමාන්‍ය මිළ 1986 දී රුපියල් 1.83 සිට 1987 දී රුපියල් 3.29 දක්වා සියයට 80 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. 1987 දී පොල් ගෙඩියක් සඳහා ශත 62 ක් වශයෙන් ගණන් බලන ලද නිෂ්පාදන වියදම 1986 පැවති ශත 66 ට වඩා සියයට 6 කින් අඩු විය. මුලින් සඳහන් කරන ලද අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන ඇතැම් වගා ක්‍රම භාවිතය අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

පොල් සඳහා වූ ස්ථායීකරණ අරමුදල යටතේ 1987 දී ආධාර කිරීමේ වැඩ පිළිවෙලවල් දෙකක් ක්‍රියාත්මක විය. පොල් පොහොර ප්‍රවාහනය කිරීමේ වියදම් සඳහා සහනාධාරයක් සැපයීම සහ ප්‍රතිලේඛනගත කරන ලද පොල් පොහොර ණය සම්බන්ධව පොළී ගෙවීම් සඳහා සහනාධාරයක් සැපයීම එම වැඩ පිළිවෙලවල් විය. පළමුවන වැඩ පිළිවෙල යටතේ පොල් පොහොර බෙදා හරින්නන්ට ඒවා බෙදා හැරීම සඳහා පොහොර මෙට්‍රික් ටොන් එකකට රුපියල් 150 ක සහනාධාරයක් දෙන ලදී. වගා කරුවන් විසින් පොල් පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ මහජන බැංකුවෙන් සහ ලංකා බැංකුවෙන් ලබා ගත් ප්‍රතිලේඛනගත කරන ලද ණය සම්බන්ධයෙන් වූ පොළී සඳහා මෙම දෙවන වැඩ පිළිවෙල යටතේ සහනාධාර සපයන ලදී. ස්ථායීකරණ අරමුදල වෙනුවෙන් පොල් සංවර්ධන අධිකාරිය විසින් මෙම යෝජනා ක්‍රම දෙක ක්‍රියාත්මක කරන ලදී. පොල් මිළ ගණන් ඉහළ යාමත් සමඟම මෙම පිහිටාධාර යෝජනා ක්‍රම දෙක ක්‍රියාත්මක කිරීම 1987 දෙසැම්බර් මස 31 වැනිදා සිට අත්හිටුවන ලදී.

අපනයනය කිරීම හා සම්බන්ධ ලිපි ලේඛන කටයුතු අවම කිරීමත්, පොල් නිෂ්පාදන අපනයනය කිරීම කෙරෙහි බලපාන සීමාකාරී රෙගුලාසි ඉවත් කිරීමත් සැළකිල්ලට ගනිමින් රජය විසින් කොප්පරා, පොල් තෙල්, කපාපු පොල් සහ කොහු කෙඳි සඳහා පැවති අපනයන බලපත්‍ර ක්‍රමය 1987 දෙසැම්බර් 1 වෙනිදා සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී. කෙසේ වුවද, ගැනුම් කරුවන්ගේ හා විකුණුම් කරුවන්ගේ යහපත සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් කොප්පරා වෙන්දේසිය සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සියළුම සේවාවන්

සැපයීම අඛණ්ඩව කරගෙන යන ලදී. තවද, පොල් සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති මෝල්වලදී අපනයනය සඳහා නිපදවන කපාපු පොල් ලේබල් කිරීම, සාම්පල් කිරීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ වැඩපිළිවෙල 1987 වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතිණ.

**සුළු අපනයන භෝග**

සුළු අපනයන භෝග වැඩි වශයෙන් ගෙවතුවල වගා කරන දිගු කාලීන භෝග සමූහයකින් සමන්විත වේ. එහෙයින් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය හෝ නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ නිවැරදි දත්තයන් ලබා ගැනීම අපහසුය. එසේ වුවද, එම භෝගවල නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන හෙයින් එම අපනයන පරිමාව නිෂ්පාදනයට ආසන්න ආදේශකයක් ලෙස සළකනු ලැබේ.

අපනයන දත්තයන් මත පදනම් වූ, 1987 වසර තුළ සුළු අපනයන භෝගවල නිෂ්පාදන ප්‍රගතිය මිශ්‍ර ක්‍රියාකාරීත්වයකින් යුක්ත වූ බවක් පෙනිණ. අපනයන පරිමාව කැපී පෙනෙන ප්‍රමාණයකින් වැඩිවීමෙන් 1987 දී කජු සහ ගම්මිරිස් නිෂ්පාදන සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවූ බව පිළිබිඹු වේ. 1987 දී කජු අපනයන පරිමාව දෙගුණයකටත් වඩා ඉහළ නැඟුණි. 1986 දී සියයට 5 කින් වැඩිවූ ගම්මිරිස් අපනයන පරිමාව 1987 දී සියයට 58 කින් වැඩි විය. එසේ වුවද, නිෂ්පාදනයේ අඩුවීම පිළිබිඹු කරමින් ප්‍රධාන භෝග වර්ග තුනක් වන කරදමුංගු, සාදික්කා හා වසාවාසි සහ කරාබුනැටිවල අපනයන පරිමාව පිළිවෙලින් සියයට 34 කින්, සියයට 26 කින් සහ සියයට 30 කින් අඩු විය.

සුළු අපනයන භෝග අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1986 දී මෙට්‍රික් ටොන් 2,356 සිට 1987 දී මෙට්‍රික් ටොන් 3,191 දක්වා සියයට 35 කින් වැඩි විය.

සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව මෙම භෝගවල වගා කටයුතු දියුණු කිරීම සඳහා පිහිටාධාර යෝජනා ක්‍රමය 1987 දීද තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. සුළු අපනයන භෝග පිහිටාධාර ක්‍රමය යටතේ අළුතින් වගා කරන ලද, නැවත වගා කරන ලද සහ පුනරුත්ථාපනය කරන ලද මුළු බිම් ප්‍රමාණය 1987 දී හෙක්ටයාර 1,087 දක්වා සියයට 29 කින් සැළකිය යුතු ලෙස වැඩි විණ. සතුටුදායක අපනයන මිළ ගණන්වල බලපෑම පිළිබිඹු කරමින් කුරුඳු පුනරුත්ථාපනය සහ ගම්මිරිස් අළුතින් වගා කිරීම සැළකිය යුතු ලෙස වැඩි විය. 1987 දී සුළු අපනයන භෝග පිහිටාධාර යෝජනා ක්‍රමය යටතේ ගෙවන ලද සහනාධාර ප්‍රමාණය 1986 දී රුපියල් දශ ලක්ෂ 12 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 13.9 දක්වා සියයට 16 කින් වැඩි විය. නිෂ්පාදනය සහ අපනයනය වඩාත් දිරිගන්වනු සඳහා, සුළු අපනයන භෝග සඳහා වන අපනයන බදු, රජය විසින් 1987 නොවැම්බර් මාසයේදී අවලංගු කරන ලදී.

සුළු අපනයන භෝග මුළු අපනයනවලින් සුළු ප්‍රමාණයකට පමණක් දායක වුවද, මෙම භෝගයන්හි නිෂ්පාදනය මෙන්ම අපනයන ඉපැයීම් වැඩි කිරීමට විශාල ලෙස ඉඩ ප්‍රස්ථා ඇති හෙයින් එම ඉඩ ප්‍රස්ථාවන් උපයෝජනය කිරීම සඳහා ඵලදව වැඩි කිරීමට ඇති තාක්ෂණික බාධක සහ ඒවා ඉවත් කළ හැකි ක්‍රම අවබෝධ කර ගැනීම වැදගත් වේ. වඩාත් උචිත ව්‍යාප්ති සේවා සැපයීමද මෙහිලා වැදගත් වන තවත් පියවරකි.

**වී**

1987 වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.1 දක්වා (වී බුසල් දශ ලක්ෂ 102 ක් නැතහොත් සහල් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.5) සියයට 18 කින් අඩු විය. මෙය වී නිෂ්පාදනය පහත වැටුණු දෙවැනි අනුක්‍රමික වසර වූ අතර, 1979 වසරට පසුව වූ පහළම වී නිෂ්පාදන මට්ටම විය.

1987 නිෂ්පාදනය පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ වගා වර්ෂයතුළ ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශයන්ගෙන් බොහොමයක දිගුකාලයක් පැවති නියං කාලගුණික තත්ත්වයයි. ජලය හිඟකම, වගා කටයුතු ඇරඹීම පමා කිරීමට සහ වගා කළ බිම් ප්‍රමාණය අඩු කිරීමට හේතුවූවා

පමණක් නොව, පොහොර යෙදීම සහ අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය අඩු කිරීමටද මුල්වූ අතර, 1986/87 මහ සහ 1987 යල යන කන්න දෙක තුළ නිෂ්පාදනයේ පහත වැටීම එහි ප්‍රතිඵලය විය. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි පැවති අස්ථාවර තත්ත්වයන්ද වසර තුළදී වී නිෂ්පාදනය සැළකිය යුතු ලෙස පහත වැටීමට හේතු විය.

1986/87 මහ කන්නයේ මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.39 ක් (බුසල් දශ ලක්ෂ 66.7 ක්) ලෙස ගණන් බලා ඇති වී නිෂ්පාදනයෙහි පසුගිය වසරේ මහ කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 18 ක සැළකිය යුතු පහත වැටීමක් විය. 1985/86 මහ කන්නයේ අස්වැන්නෙන් සියයට 30 ක් පමණ වූ කුරුණෑගල, මන්නාරම, අනුරාධපුර සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි වී නිෂ්පාදනයෙහි එකතුව 1986/87 මහ කන්නයේදී විශාල ලෙස පහත වැටීමක් වාර්තා කරන ලදී.

පසුගිය යල කන්නය හා සැසඳීමේදී 1987 යල කන්නයේ නිෂ්පාදනයද සියයට 18 කින් නැතහොත් මෙට්‍රික් ටොන් 164,675 කින් පහත වැටුණි. 1986 යල කන්නයේ මුළු නිමැවුමෙන් සියයට 12 ක් පමණ වූ කුරුණෑගල, මන්නාරම, අනුරාධපුර සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි වී නිෂ්පාදනයේ එකතුව 1987 යල කන්නයේදී සියයට 35 කින් නැතහොත් මෙට්‍රික් ටොන් 38,263 කින් පහත වැටුණි.

## 1 . 13 සංඛ්‍යා සටහන

### වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1986 – 1987

| ශීර්ෂය | ඒකකය | 1986 | | | 1987(අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| 1. දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 555 | 340 | 895 | 508 | 273 | 781 |
| 2. පොහොර නිකුතුව (ආ) .. | මෙට්‍රික් ටොන් දහස් | 124 | 73 | 197 | 115 | 36 | 151 |
| 3. දෙන ලද ණය ප්‍රමාණය .. | රුපියල් දශ ලක්ෂ | 101 | 89 | 190 | 183 | 79 | 262 |
| 4. අස්වැන්න කපාගන්නා ලද දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 527 | 308 | 835 | 433 | 246 | 679 |
| 5. හෙක්ටයාරයක පලදාව (ඇ) | කිලෝ ග්‍රෑම් | 3,585 | 3,287 | 3,500 | 3,678 | 3,362 | 3,564 |
| 6. අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 468 | 271 | 739 | 380 | 217 | 597 |
| 7. නිෂ්පාදනය .. | මෙට්‍රික් ටොන් දහස් | 1,688 | 900 | 2,588 | 1,392 | 735 | 2,128 |
| | (බුසල් දහස්) | (80,896) | (43,130) | (124,026) | (66,727) | (35,239) | (101,966) |
| 8. සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගැනීම් (ඈ) .. | මෙට්‍රික් ටොන් දහස් | 138 | 16 | 154 | 57 | 07 | 64 |
| 9. සහල් ආනයන .. | ,, | — | — | 220 | — | — | 102 |
| (වී සමානය) .. | ,, | — | — | (314) | — | — | (146) |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම සංවර්ධනය සහ පර්යේෂණ අමාත්‍යාංශය;
වී අලෙවි මණ්ඩලය;
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) පොහොර නිකුත් කිරීම, වගා වර්ෂය තුළදී සහ ලිත් වර්ෂය තුළදී එකිනෙකට වෙනස් වේ. වගා වර්ෂය මහ (සැප්තැම්බර්/ඔක්තෝබර්–මාර්තු/අප්‍රේල්) සහ යල (අප්‍රේල්/මැයි–අගෝස්තු/සැප්තැම්බර්) කන්නවලින් යුක්ත වේ.

(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොටගත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු වී නිෂ්පාදනය අස්වනු නෙලාගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය පලදාව ගණනය කරන ලදී.

(ඈ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි–ජූලි කාලච්ඡේදය තුළදී මිළදී ගත් අතර, යල කන්නයේ අස්වැන්න අගෝස්තු–දෙසැම්බර් කාලච්ඡේදය තුළ මිළදී ගන්නා ලදී.

පසුගිය වසර හා සැසඳීමේදී 1987 වගා වර්ෂය තුළදී හෙක්ටයාරයක සාමාන්‍ය එලදව කිලෝ ග්‍රෑම් 3,564 දක්වා සියයට 2 කින් පමණ සුළු වශයෙන් වැඩිවූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවලින් ලත් ඉහළ සාමාන්‍ය එලදවයි. 1986/87 මහ කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදව පෙර වසරේ මහ කන්නයට වඩා සියයට 2.6 කින් වැඩිවී කිලෝ ග්‍රෑම් 3,678 ක් විය. මහ කන්නයේදී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 5,973 ක ඉහළම සාමාන්‍ය එලදව උඩවලව ප්‍රදේශයෙන් වාර්තා වූ අතර, එය පෙර වසරේ මහ කන්නයේ ඉහළම එලදවට වඩා සියයට 17 කින් වැඩිවිය. මහවැලි ' එච් ' ප්‍රදේශය විසින් 1986/87 මහ කන්නයේදී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 5,272 ක මීළඟ ඉහළම එලදව වාර්තා කරන ලදී. සාමාන්‍ය එලදවේ වැඩිවීම 1986/87 මහ කන්නයේදී පොහොර වැඩි වශයෙන් භාවිතා කරනු ලැබූ ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවලට බෙහෙවින්ම සීමා විය.

පසුගිය යල කන්නය හා සැසඳීමේදී 1987 යල කන්නයේදීද හෙක්ටයාරයක සාමාන්‍ය එලදව කිලෝ ග්‍රෑම් 3,362 ක් දක්වා සියයට 2.3 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. මහ කන්නයේදී මෙන් නොව වර්ෂාපෝෂිත ප්‍රදේශයන්හි සාමාන්‍ය එලදව මගින් ඇති කළ අහිතකර බලපෑම සමහන් කළ සුළු වාරිමාර්ග ප්‍රදේශයන්හි එලදවෙහි වර්ධනය මෙම සාමාන්‍ය එලදවෙහි වැඩි වීමට හේතු විය. 1987 යල කන්නයේ ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල එලදව එයට පෙර යල කන්නයේ පැවති මට්ටමෙහිම තිබුණි. මෙම කන්නයෙහි හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,602 ක් වූ ඉහළම එලදවක් වාර්තා වූයේ උඩවලව ප්‍රදේශයෙනි. හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,280 ක මීළඟ ඉහළම එලදව අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, අනතුරුව වූයේ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,261 ක සාමාන්‍ය එලදවක් සහිත වූ හම්බන්තොට දිස්ත්‍රික්කයයි.

පසුගිය වර්ෂය හා සසඳා බලන කල 1987 වර්ෂයේදී වී වගාව යටතේ වූ දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 13 කින් අඩු විය. 1986/87 මහ කන්නයේදී දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 507,830 දක්වා සියයට 9 කින් පහත වැටුණු අතර, යල කන්නයේදී එය හෙක්ටයාර 273,396 දක්වා සියයට 20 කින් අඩු විය. කුරුණෑගල, අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය යන ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයෙහි සැළකිය යුතු අඩු වීමක් වාර්තා විය. 1986/87 මහ කන්නයේදී සුළු වාරිමාර්ග යටතේ වගා කළ බිම් ප්‍රදේශයන්හි දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 19 කින් විශාල ලෙස පහත වැටුණු අතර, වර්ෂාපෝෂිත සහ විශාල වාරිමාර්ග යටතේ දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 6.8 ක සහ සියයට 3.8 ක සාපේක්ෂව අඩු ප්‍රමාණයන්ගෙන් පහත වැටුණි. යල කන්නයේදී ද සුළු වාරිමාර්ග යටතේ දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 30 ක පමණ විශාල අඩු වීමක් පෙන්නුම් කළ අතර, වර්ෂාපෝෂිත සහ විශාල වාරිමාර්ග යටතේ වගා කළ ප්‍රදේශයන්හි සියයට 18 ක සහ සියයට 17 ක අඩුවීම් වාර්තා විය.

පසුගිය වර්ෂය හා සසඳා බලන කල 1987 වර්ෂයේදී අස්වැන්න නෙලාගත් දළ බිම් ප්‍රමාණය සියයට 19 ක අඩු වීමක් වාර්තා කරන ලදී. 1986/87 මහ කන්නයේදී අස්වැන්න නෙලාගත් දළ බිම් ප්‍රමාණය සියයට 18 කින් අඩුවූ අතර, යල කන්නයේදී එය සියයට 20 කින් අඩු විය. ප්‍රධාන වශයෙන්ම දැඩි නියගය හේතුකොට ගෙන 1987 වසරේදී වපුරන ලද දළ බිම් ප්‍රමාණය සහ අස්වනු නෙලාගත් දළ බිම් ප්‍රමාණයන් අතර වෙනස හෙක්ටයාර 102,479 ක් නැතහොත් දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 13 ක් විය. මහ කන්නයේ වගා පාලුව වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 15 ක පමණ ඉහළ මට්ටමක විය. යල කන්නයේ එය සියයට 10 ක් පමණ විය. දැඩි නියග තත්ත්වය බෙහෙවින් බලපාන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි දෙකන්නයෙහිම ඉහළම වගා හානිය දක්නට ලැබුණි. 1986/87 මහ සහ 1987 යල කන්නයන්හිදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි අස්වනු නෙලාගත් දළ බිම් ප්‍රමාණයන් දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් සියයට 32 ක් සහ සියයට 53 ක් විය. නියග තත්ත්වය නිසා කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළුමනින්ම වගා පාලු වූ බිම් ප්‍රමාණය මහ කන්නයේදී දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 50 ක් සහ යල කන්නයේදී සියයට 33 ක් විය.

කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍යාංශයට අනුව 1987 වගා වර්ෂය තුළ වී වගා අංශය සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 150,900 ක් විය. මෙය පසුගිය වගා වර්ෂයේ නිකුත් කළ පොහොර ප්‍රමාණයට වඩා සියයට 23 කින් අඩු විය. 1986/87 මහ කන්නයේදී නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 115,320 දක්වා සියයට 7 කින් අඩු වූ අතර, යල කන්නයේදී මෙට්‍රික් ටොන් 35,576 දක්වා සියයට 51 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. පොහොර භාවිතයේ අඩුවීම, අයහපත් කාළගුණික තත්ත්වයන් සහ වපුරන ලද දළ බිම් ප්‍රමාණය අඩු වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. පෙර වසරේ අදළ කන්නයන් සමඟ සසඳන කල, මහ කන්නයේදී වපුරන ලද හෙක්ටයාරයක් සඳහා භාවිතා කළ සාමාන්‍ය පොහොර ප්‍රමාණය සියයට එකකින් සුළු වශයෙන් වැඩිවූ අතර, 1987 යල කන්නයේදී එය සියයට 41 කින් අඩු විය. ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සපයන ලද තොරතුරුවලට අනුව 1987 ලිත් වර්ෂය තුළදී වී වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1986 වසරේ නිකුත් කළ ප්‍රමාණයට වඩා සියයට 8 ක පමණ අඩු වීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 215,036 ක් විය.

අපතේ යෑම් සහ බිත්තර වී අවශ්‍යතා සඳහා ගැලපීම් කළ පසු 1987 මුළු වී නිෂ්පාදනයේ සහල් සමානය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.3 ක් එසේ නැතහොත් ගණන් බලන ලද මුළු වාර්ෂික සහල් පරිභෝජනයෙන් සියයට 80 ක් පමණ විය. විමර්ශනයට භාජනය වන වර්ෂය ආරම්භයේදී ආහාර කොමසාරිස් වෙත සහල් මෙට්‍රික් ටොන් 155,500 ක තොගයක් තිබූ අතර, වර්ෂය තුළදී සහල් මෙට්‍රික් ටොන් 102,416 ක් ආනයනය කරන ලදී.

පසුගිය වර්ෂයේදී කළ මිළදී ගැනීම් හා සසඳා බලන කල 1987 දී සියයට 58 ක සැළකිය යුතු පහත වැටීමක් පෙන්නුම් කරමින් වී අලෙවි මණ්ඩලය විසින් සහතික මිළ යෝජනා ක්‍රමය යටතේ වී මෙට්‍රික් ටොන් 63,868 (බුසල් දශ ලක්ෂ 3.1) ක් මිළදී ගන්නා ලදී. මෙය, 1953 න් පසු සහතික මිළ යෝජනා ක්‍රමය යටතේ මිළදී ගත් අවම වී ප්‍රමාණය විය. කෙසේ වුවද, සමුච්චිත වී තොගයන් ප්‍රයෝජනයට ගනිමින් වර්ෂය තුළදී ආහාර කොමසාරිස්ගේ සහල් අවශ්‍යතාවය සපුරාලීමට වී අලෙවි මණ්ඩලයට හැකි විය. වියළි කලාපයේ නියඟය බලපාන ලද ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවලින් කළ මිළදී ගැනීම්වල අඩුවීම වී මිළදී ගැනීම්වල මෙම සැළකිය යුතු අඩු වීමට විශාල වශයෙන් හේතු විය. 1986 වසරේ මුළු මිළදී ගැනීම්වලින් සියයට 74 ක් වූ අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවලින් මිළදී ගත් ඒකාබද්ධ වී ප්‍රමාණය 1987 දී මෙට්‍රික් ටොන් 41,669 දක්වා (මුළු වී මිළදී ගැනීම්වලින් සියයට 65) සියයට 63 කින් පහත වැටුණි. වී නිෂ්පාදනයෙහි අඩුවීම, විශේෂයෙන් නැගෙනහිර පළාතේ පැවති අස්ථාවර තත්ත්වය සහ පෞද්ගලික අංශයේ වී වෙළෙඳුන්ගේ වඩාත් කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය යන සාධකයන්ගේ එක්වීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

විවෘත වෙළෙඳපොලේ වී මිළ ගණන් වසර පුරාම වී බුසලක සහතික මිළ වූ රුපියල් 70.00 ට වඩා (කිලෝ ග්‍රෑමය රුපියල් 3.35) ඉහළ මට්ටමක පැවතිණි. වී බුසලක් සඳහා රුපියල් 87.84 (කිලෝ ග්‍රෑමය රුපියල් 4.20) ක් වූ විවෘත වෙළෙඳපොලේ වාර්ෂික සාමාන්‍ය මිළ 1986 මිළට වඩා සියයට 4 කින් වැඩි විය. විවෘත වෙළෙඳපොලේ වී බුසලක් සඳහා වූ සාමාන්‍ය මිළ සහ සහතික මිළ අතර වෙනස 1987 වසරේ පළමු භාගයේදී රුපියල් 16.09 සිට දෙවන භාගයේදී රුපියල් 19.59 දක්වා වැඩි විය. යල සහ මහ කන්නයන්හි නිෂ්පාදනයේ අඩුවීම නිසා ප්‍රධාන වශයෙන් වෙළෙඳපොලෙහි තිබූ සහල් ප්‍රමාණයෙහි අඩුවීම විවෘත වෙළෙඳපොලෙහි වී මිළ ගණන්වල වැඩිවීමේ ප්‍රවනතාවය තුළින් පිළිබිඹු විය. එම ප්‍රවනතාවයට අනුව යමින් කැකුළු, තම්බාපු සහ සම්බා සහල් වර්ග සඳහා වූ විවෘත වෙළෙඳපොල මිළ ගණන්ද වසරතුළදී ඉහළ නැඟුණි. වර්ෂය තුළදී සම්බා කිලෝ ග්‍රෑමයක මිළ රුපියල් 10.29 සිට රුපියල් 11.90 දක්වා පරතරයක පැවැති අතර, තම්බාපු සහල් කිලෝ ග්‍රෑමයක මිළ රුපියල් 7.11 සිට රුපියල් 8.12 දක්වා පරතරයක පැවතිණ. කැකුළු සහල් කිලෝ ග්‍රෑමයක මිළ ගණන් රුපියල් 7.56 සහ රුපියල් 8.33 අතර උච්චාවචනය විය.

1987 දෙසැම්බර් මාසයේදී අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ කොමසාරිස් විසින් 1979 අංක 1 දරණ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනතට අනුව කැකුළු සහ තම්බාපු සහල් නිෂ්පාදනය සහ අලෙවි කිරීම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලව කළයුතු බවට වී මෝල් හිමියන්ට සහ සහල් වෙළෙඳුන්ට විධාන කරන ලදී. ඒ අනුව, මෝල් හිමියන් සිය සහල් සැපයුම් විශේෂ, 1 වැනි ශ්‍රේණිය, 2 වැනි ශ්‍රේණිය, 3 වැනි ශ්‍රේණිය සහ අව ශ්‍රේණි වශයෙන් වර්ග කළයුතු විය. 1987 වසර අවසානයේ දී වී අලෙවි මණ්ඩලය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනතේ නියමයන්ට අනුව ප්‍රමිතිකරණයට අනුකූලව වී කෙටීම සහ සහල් අලෙවි කිරීම ආරම්භ කරන ලදී.

**සීනි**

පසුගිය වසරේදී මෙට්‍රික් ටොන් 34,325 ක ඉහළ මට්ටමක් වාර්තා කරන ලද සීනි නිෂ්පාදනය, 1987 දී මෙට්‍රික් ටොන් 29,304 දක්වා සියයට 15 කින් පහත වැටුණි. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සීනි නිෂ්පාදනය සියයට 29 කින් සැළකිය යුතු ලෙස අඩු වී මෙට්‍රික් ටොන් 15,035 ක්වූ අතර, පුද්ගලික අංශයේ සීනි නිෂ්පාදනය 1986 දී මෙට්‍රික් ටොන් 13,116 සිට 1987 දී මෙට්‍රික් ටොන් 14,269 දක්වා සියයට 9 කින් වැඩි විය.

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ නිමැවුම පහත වැටීමට විශාල වශයෙන් හේතු වූයේ කන්තලේ සහ සෙවනගල කම්හල්වල නිෂ්පාදනය අඩු වීමයි. කන්තලේ කම්හලෙහි 1987 සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,288 ක් දක්වා සියයට 66 කින් අඩු වූ අතර, සෙවනගල කම්හලෙහි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4,107 දක්වා සියයට 37 කින් පහළ වැටුණි. කෙසේ වුවද, හිඟුරාන කම්හලෙහි සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8,640 ක් දක්වා සියයට 9 කින් ඉහළ නැඟුණි. දිගු කාලයක් පැවති නියං කාලගුණික තත්ත්වයන් නිසා මිරිකීම සඳහා උක් දඬු සැපයුම අඩු වීමත්, උක් දඬුවල තත්ත්වය බාල වීමත් ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ කම්හල්වල මුළු සීනි නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීමට හේතු විය. කන්තලේ වැව් බැම්ම බිඳී යෑම නිසා ඇති වූ නිෂ්පාදනයේ පහත වැටීම අසතුටුදායක කාලගුණික තත්ත්වයන් මගින් තවදුරටත් උග්‍ර වූයෙන් කන්තලේ කම්හලෙහි නිෂ්පාදනය තියුණු පසු බැසීමකට ලක් විය. සිවිල් කලබල ද කන්තලේ සහ හිඟුරාන කම්හල්වල නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. වසර තුළදී ත්‍රස්තවාදී කටයුතු සහ කම්කරු හිඟය නිසා විශාල බිම් ප්‍රමාණයක අස්වනු නෙලා ගනු නොලැබිණ. පැල්වත්ත සීනි කම්හලෙහි 1987 නිපැයුම් ඉලක්කය මෙට්‍රික් ටොන් 32,000 ක් පමණ වුවද, දරුණු ලෙස බලපෑ නියඟය හේතුකොටගෙන නිෂ්පාදනය කිරීමට හැකි වූයේ මෙට්‍රික් ටොන් 14,269 ක් පමණි.

උක් වගාව යටතේ පැවති මුළු බිම් ප්‍රමාණය (නිරි වගාව ඇතුළුව) 1986 දී 10,577 සිට 1987 දී හෙක්ටයාර 10,461 දක්වා සියයට එකකින් සුළු වශයෙන් පහත වැටුණි. පසුගිය වසර හා සැසඳීමේදී 1987 දී කන්තලේ කම්හල යටතේ උක් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 977 දක්වා සියයට 49 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණ අතර, සෙවනගල කම්හලෙහි එම බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,949 දක්වා සියයට 7 කින් අඩු විය. එයට වෙනස්ව යමින් හිඟුරාන කම්හල සහ පැල්වත්ත සමාගම යටතේ පාලනය වන උක් වගා කරන ලද බිම් ප්‍රමාණය 1987 දී පිළිවෙලින් සියයට 8 කින් සහ සියයට 19 කින් වැඩි වී හෙක්ටයාර 2,331 ක් සහ හෙක්ටයාර 5,204 ක් විය.

දිගු කාලයක් පැවති නියඟය හේතුකොටගෙන උක් දඬුවල අඩංගු සීනි ප්‍රමාණය අඩු වීම නිසා සියළුම සීනි කම්හල්වල සීනි ලබා ගැනීමේ අනුපාතයන්ගේ සාමාන්‍යය 1986 දී සියයට 7.79 සිට 1987 දී සියයට 7.35 දක්වා අඩු විය. කන්තලේ කම්හලෙහි සීනි ලබා ගැනීමේ අනුපාතිකය 1986 දී සියයට 8.09 සිට 1987 දී සියයට 6.70 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටුණු අතර, හිඟුරාන, සෙවනගල සහ පැල්වත්ත කම්හල්වල සීනි ලබා ගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 7.30 සියයට 7.67 සහ සියයට 7.41 දක්වා අඩු විය. 1987 දී

කන්තලේ කම්හල මගින් මිළදී ගත් උක් දඬු ප්‍රමාණය සියයට 24 කින් පහත වැටුණ ද, සියළුම සීනි කම්හල් මගින් පෞද්ගලික වගා කරුවන්ගෙන් මිළදී ගත් මුළු උක් දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 75,101 දක්වා සියයට 27 කින් සැළකිය යුතු අයුරින් වැඩි විය.

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට අයත් කම්හල්වල සීනි නිෂ්පාදන පිරිවැය පිළිබඳ දත්ත ලබා ගත නොහැකිය. සීමාසහිත පැල්වත්ත සීනි සමාගමෙහි නිෂ්පාදන වියදම 1986 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 24.57 සිට 1987 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 38.50 දක්වා සියයට 57 කින් වැඩි වී යැයි ගණන් බලා ඇත. රුපියලේ අගය නොකඩවා හීන වීම සමඟ විදේශ ණය සඳහා පොළී ගෙවීම් ඉහළ යාම මෙන්ම අසතුටුදයක කාලගුණික තත්ත්වයන් නිසා නිෂ්පාදනය ඉලක්ක කළ ප්‍රමාණයට වඩා අඩු වීමත් නිෂ්පාදන පිරිවැයෙහි මෙම තියුණු වැඩි වීමට යම් ප්‍රමාණයකට හේතු විය. සීනි සඳහා ඇති විවෘත වෙළෙඳපොල මිළ සහ නිෂ්පාදන පිරිවැය අතර වෙනස රජය විසින් පියවීමට එකඟ වී ඇති හෙයින් පැල්වත්ත සීනි සමාගමේ නිෂ්පාදන වියදම ඉහළ නැඟීම සැළකිල්ලට ගත යුතු කරුණකි.

1987 දී සීනි ආනයනය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් සඳහන් කළයුතු තරම් වෙනසක් සිදු විය. 1987 අප්‍රේල් පළමුවැනිදා සිට ආහාර කොමසාරිස් විසින් සීනි සම්බන්ධව කටයුතු කිරීම නවතා දමන ලදී. මීට පෙර ආහාර කොමසාරිස් විසින් තබා ගන්නා ලද සීනි සම්භාර තොග අන්තර් ජාතික සමාගමක් වූ ඊ. ඩී. සහ එෆ්. මෑන් (සීනි) සමාගමට පවරා දෙන ලදී. ප්‍රතිශෝධිත වැඩපිළිවෙල යටතේ දේශීය සීනි නිෂ්පාදනය මිළදී ගැනීම මෙන්ම බෙදා හැරීම සඳහා හෝ සම්භාර තොග පවත්වා ගැනීම සඳහා හෝ ආහාර කොමසාරිස් විසින් සීනි ආනයනය කිරීම අවශ්‍ය නොවේ. ආනයනය කිරීම හෝ දේශීය වෙළෙඳපොලින් සීනි මිළදී ගැනීම හෝ මුළුමනින්ම වාගේ පෞද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කෙරුණි. පෞද්ගලික අංශයේ ආනයනකරුවන් සහ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, පැල්වත්ත සීනි සමාගමේ සීනි එකඟ වූ මිළකට ගත යුතු විය.

**අතුරු ආහාර භෝග**

අර්තාපල්, මිරිස් සහ රතු ළූනු වැනි භෝග කිහිපයක් හැරුණුකල අනෙකුත් බොහෝ අතුරු ආහාර භෝග වගා කරනු ලබන්නේ හේන් ගොවිතැන් වශයෙන් හෝ ගෙවතුවල මිශ්‍ර භෝග වශයෙනි. එමනිසා මෙම භෝගයන් පිළිබඳව ලැබී ඇති දත්තයන්හි අඩුපාඩු ගණනාවක් ඇති අතර, එම දත්තයන් දළ වශයෙන් ගණනය කරන ලද ඒවා වේ.

කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සපයන ලද තාවකාලික දත්තයනට අනුව 1987 වර්ෂය තුළදී අතුරු ආහාර භෝග ගණනාවක නිෂ්පාදනය වැඩි විය. 1987 වගා වර්ෂය තුළදී උඳු, මුං ඇට, කව්පි, බඩ ඉරිඟු, තල සහ රතු ළූනු නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූයේ වගා කළ බිම් ප්‍රමාණයෙහි වැඩි වීමයි. සමහරවිට වර්ෂය තුළදී නියඟය වී වගාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම නිසා අවම ආදායම් මට්ටමක් සහ ආහාර පිළිබඳව සුරක්ෂිත බවක් සහතික කිරීම පිණිස වියළි කලාපයේ බොහෝ ගොවීන් අතුරු ආහාර භෝග වගා කිරීමට නැඹුරු වීමටත්, එහෙයින් මෙම භෝග වගා කළ බිම් ප්‍රමාණය වැඩි කිරීමටත් පෙළඹෙන්නට ඇත.

වැඩි වටිනාකමින් යුතු අතුරු ආහාර භෝග අතුරින් රතු ළූනු නිෂ්පාදනයේ පමණක් වැඩි වීමක් වාර්තා වූ අතර, අර්තාපල්, මිරිස් හා බොම්බයි ළූනු නිෂ්පාදනවල පහත වැටීමක් දක්නට ලැබුණි. නියඟ තත්ත්වයන් තියුණු ලෙස මිරිස් වගාව කෙරෙහි බලපෑම නිසා වර්ෂය තුළදී නිෂ්පාදනය සියයට 39 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි.

1986/87 මහ කන්නය තුළදී රතු ළූනු, මුං ඇට, කව්පි, උඳු සහ බඩ ඉරිඟු නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි විය. 1987 යල කන්නයේදී ද මෙම භෝග වලින් වැඩි ගණනක නිෂ්පාදනයේ සැළකිය යුතු වැඩි වීමක් වාර්තා කරන ලදී. යල කන්නයේදී කව්පි නිෂ්පාදනය සියයට 60 කින් වැඩි වූ අතර, උඳු නිෂ්පාදනය තුන් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි විය. සෝයා බෝංචි නිෂ්පාදනය මහ කන්නයේදී සියයට 3 කින් සහ යල කන්නයේදී සියයට 24 කින් අඩු වී, කන්න දෙක තුළදීම පහත වැටීමක් පෙන්වීය.

අතුරු ආහාර භෝග අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1987 දී මෙට්‍රික් ටොන් 20,207 දක්වා සියයට 6 කින් වැඩි විය.

වී අලෙවි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තෝරා ගත් අතුරු ආහාර භෝග අටක් සඳහා වූ පදනම් මිළ යෝජනා ක්‍රමය වසර තුළදී තවදුරටත් ක්‍රියාත්මක විය. 1987 ජනවාරි මාසයේදී රට කජු, තල සහ උඳු සඳහා පදනම් මිළ ගණන් වැඩි කරන ලදී. රට කජු සඳහා වන පදනම් මිළ කිලෝ ග්‍රෑමයකට රුපියල් 7 දක්වා ශත 75 කින් වැඩි කළ අතර, උඳු සඳහා එම මිළ කිලෝ ග්‍රෑමයකට රුපියල් 6.00 දක්වා වැඩි කරන ලදී. සුදු පැහැති තල සහ කළු පැහැති තල සඳහා මිළ ගණන් පිළිවෙලින් කිලෝ ග්‍රෑමයකට රුපියල් 9.00 ක් සහ රුපියල් 7.50 ක් දක්වා වැඩි කෙරුණි. වර්ෂය තුළදී පදනම් මිළ යෝජනා ක්‍රමය යටතේ වී අලෙවි මණ්ඩලය විසින් බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 6,880 ක් මිළදී ගන්නා ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ 1987 දී මිළදී ගන්නා ලද සෝයා බෝංචි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 705 දක්වා මෙට්‍රික් ටොන් 281 කින් හෙවත් සියයට 66 කින් වැඩි විය. 1987 වර්ෂය තුළදී ද වී අලෙවි මණ්ඩලය විසින් මිළදී ගත් කව්පි, මුං ඇට, තල සහ කුරක්කන් ප්‍රමාණය පෙර වර්ෂවලදී මෙන් ම අඩු ප්‍රමාණයක පැවතුණි.

අතුරු ආහාර භෝග අංශය වර්ධනය වීමට අවකාශ තිබුණ ද, මෙම අංශයේ දියුණුවට බාධක කිහිපයක් ද ඇත. සාපේක්ෂව ආයතනික සහයෝගය අඩුව පැවතීම, විවිධ වගා ප්‍රදේශයනට ගැලපෙන්නා වූ වැඩි දියුණු කළ බීජ වර්ගවල සීමිත සැපයුම සහ අලෙවිකරණයේදී ඇති වන අපහසුකම් මෙයට ඇතුළත් වේ. මෙම සාධක වල එක් ප්‍රතිඵලයක් ලෙස බොහෝ ගොවියන් තවමත් වී වගාවට වැඩි කැමැත්තක් දක්වනු ලබන බව පෙනේ. දැනටමත් රට, සහලින් ස්වයංපෝෂිත වීම කරා ළඟා වෙමින් පවතින බැවින්, කෘෂිකාර්මික අංශයේ වඩා සමබර වර්ධනයක් ඇති කර ගැනීමට නම් ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග තුළින් මෙම තේරීම් රටාවෙහි වෙනසක් කිරීමේ අවශ්‍යතාවයක් ඇත.

**ධීවර හා පශු නිෂ්පාදනය**

1987 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 190,002 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇති අතර, එය පසුගිය වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනයට වඩා සියයට 4 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 79 ක් පමණ වන වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය 1986 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 144,266 සිට 1987 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 149,278 දක්වා සියයට 3 කින් වැඩි විය. මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 2 ක් පමණ ඉතා සුළු ප්‍රමාණයක් වන වෙරළින් ඈත සහ ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය වසරෙහි නිෂ්පාදනය සමඟ සැසඳීමේදී සියයට 25 කින් වැඩි වූ අතර, මිරිදිය ධීවර අංශයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 36,465 දක්වා සියයට 3 ක සුළු වැඩි වීමක් වාර්තා කළේය. පෞද්ගලික අංශය තවදුරටත් මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙහි ප්‍රධාන දායකයා විය. ධීවර සංස්ථාව පෞද්ගලික අංශයෙන් මසුන් මිළදී ගැනීම කෙරෙහි වැඩි වශයෙන් යොමු විය.

විදේශීය මූලාශ්‍ර මඟින් මූල්‍යකරණය කරන ලද විශේෂ ධීවර සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් 1987 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය. මෙයට වයඹ වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය, නැගෙනහිර වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය, බටහිර වෙරළ ඒකාබද්ධ ධීවර ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා

මසුන් ඇති කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය ද ඇතුළත් වේ. වර්ෂය තුළදී වයඹ වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බෝට්ටු 80 ක් (අඩි 34) තනන ලද අතර ඒවා වෙළෙඳාම පිණිස මසුන් ඇල්ලීම සඳහා නිකුත් කරන ලදී. නැගෙනහිර වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1987 වසර තුළදී බෝට්ටු 20 ක තැනීම් කටයුතු නිම කරන ලදී. 1987 දී බටහිර වෙරළ ඒකාබද්ධ ධීවර ව්‍යාපෘතිය සඳහා ණය අත්හිටුවන දිනය ආසියානු සංවර්ධන බැංකුව මගින් 1988 අප්‍රේල් මාසය දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී. හම්බන්තොට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලෙහි ධීවර සංවර්ධනයට අදළ වැඩ කොටසෙහි පළමුවන අදියර වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. පුත්තලම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතේ වැල්ලමන්කර බෝට්ටු එසවීමේ පහසුකම් සැළසීමට අදළ ඉදි කිරීම් කටයුතු සහ කල්පිටියේ ධීවර සේවා මධ්‍යස්ථානයෙහි ඉදි කිරීම් කටයුතු 1987 දී සම්පූර්ණ කරන ලදී.

1987 වර්ෂය තුළදී සහනාධාර යෝජනා ක්‍රම කිහිපයක් ද නොකඩවා ක්‍රියාත්මක විය. විවිධ සහනාධාර යෝජනා ක්‍රම යටතේ මුහුදු සහ මිරිදිය ධීවර අංශයන් සඳහා දෙන ලද සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 27 ක් සහ රුපියල් දශ ලක්ෂ 1 ක් විය. පොකුණු සඳහා වූ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මසුන් ඇති කිරීම සඳහා හෙක්ටයාර 5 ක් පමණ පොකුණු සෑදීමට යොදා ගන්නා ලද අතර, ඒ සඳහා සහනාධාර වශයෙන් ගෙවන ලද මුළු ප්‍රමාණය රුපියල් 949,700 ක් විය. 1987 වර්ෂය තුළදී විවිධ සහනාධාර යෝජනා ක්‍රම යටතේ බෝට්ටු 379 ක් ද, සාමාන්‍ය යාත්‍රා 266 ක් ද, බෝට්ටු ඇන්ජින් 890 ක් සහ යාත්‍රා කඳන් 76 ක් ද ධීවර අංශය සඳහා නිකුත් කරන ලදී.

ධීවරයිනට ආධාර සැපයීම පුළුල් කිරීම සඳහා ස්වීඩන්–ශ්‍රී ලංකා සහයෝගිතා සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීම වසර තුළදී සමුපකාර ධීවර අංශයේ ඇතිවූ වැදගත් දියුණුවක් විය. ස්වීඩන් සමුපකාර මධ්‍යස්ථානය මෙයට අරමුදල් සැපයූ අතර, සමස්ත ලංකා සමුපකාර බල මණ්ඩලය මගින් මෙය ක්‍රියාත්මක කරනු ලැබේ.

ධීවර අංශයේ ක්‍රියාකාරිත්වය සමස්තයක් වශයෙන් ගත්කල අපේක්ෂිත තත්ත්වයට වඩා බෙහෙවින් පහත් මට්ටමක විය. බෙදා හැරීමේ ගැටළු, අධික ඉන්ධන වියදම, මාලු නරක් නොවී කල් තබා ගැනීමට යන අධික වියදම සහ මාළු සැපයුම ප්‍රමාණවත් නොවීම වැනි සාධකයන් එක්වීම වර්ෂය තුළදී මාළු මිළ ගණන් වැඩි කිරීම කෙරෙහි මුල් විය. පාරිභෝගික මිළ ගණන් අඛණ්ඩව ඉහළ ගිය ද, එම අධික මිළ ගණන්වල වාසිය ධීවරයන්ගේ මට්ටම දක්වා ළඟා නොවූ බැවින් රටෙහි ධීවරයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ආර්ථික වශයෙන් අවාසිදයක තත්ත්වයක පසු විය. එමනිසා නිෂ්පාදනය වැඩි කිරීමෙහි ලා උත්සාහ දරන අතරම එම උත්සාහයන්ගේ ප්‍රයෝජනය විශාල වශයෙන් නිෂ්පාදකයින් වෙත ලබාදීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. මෙහිලා සාපේක්ෂව පහත් සමාජ–ආර්ථික තත්ත්වයක පසුවන ධීවරයන්ගේ යහපත උදෙසා වසර කිහිපයක් තුළ ක්‍රියාත්මක වූ විවිධ සහනාධාර යෝජනා ක්‍රමයන්ගේ ඇගයීමක් කිරීම ඉතා ඉක්මණින් කළ යුතු කාර්යයක් වී ඇත.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ගණන් බැලීම්වලට අනුව, 1987 වර්ෂයේ නිෂ්පාදනය කළ කිරි ප්‍රමාණය (මී කිරි ඇතුළුව) ලීටර් දශ ලක්ෂ 275 ක් විය. මෙය පසුගිය වර්ෂයේ නිෂ්පාදනය කළ කිරි ප්‍රමාණය වූ ලීටර් දශ ලක්ෂ 178 හා සැසඳීමේදී සියයට 54 ක වැඩි වීමකි. 1987 වර්ෂයේදී ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ) විසින් කිරි ලීටර් දශ ලක්ෂ 69 ක් රැස් කරන ලදී. මෙය ජාතික කිරි මණ්ඩලය (1986 ජනවාරි–ජූලි) සහ මිල්කෝ (1986 අගෝස්තු–දෙසැම්බර්) යන ආයතන දෙක එකතුව 1986 වර්ෂයේ රැස් කරන ලද කිරි ප්‍රමාණයට වඩා සුළු වශයෙන් වැඩි විය.

ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතෙහි ඇති පශු නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් සතුන් බෝකිරීමේ සේවාවන් සැපයීම සහ බෝවෙන රෝග සඳහා ප්‍රතිශක්තිකරණය කිරීම වැනි ඔවුන්ගේ ආධාරක වැඩ පිළිවෙලවල්

නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. 1987 දී පශු සම්පත් අංශය දියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති කිහිපයක් නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබිණ. මෙයට ශ්‍රී ලංකා/ජර්මන් එළුවන් සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකා/ස්විට්සර්ලන්ත පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය, අනුරාධපුර වියළි කලාපීය කෘෂිකාර්මික යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා/ආසියානු සංවර්ධන බැංකු පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය ද අයත් විය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 815 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇත. එය පසුගිය වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 22 ක වැඩි වීමක් පෙන්වන ලදී. කුකුලන් ඇති කිරීමේ අංශයට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ සහනදායී පොළියකට ආයතනික මූල්‍ය පහසුකම් විශාල වශයෙන් ලැබීම නිසා එම අංශයෙහි සතුටුදායක බලපෑමක් දක්නට ලැබුණි.

**ග්‍රාමීය ණය**

ග්‍රාමීය අංශය සඳහා බැංකු ආයතන කිහිපයක් මගින් ආයතනික ණය සපයනු ලැබේ. මෙම ආයතන විසින් සපයනු ලබන ග්‍රාමීය ණයවලට භෝග වගාව සඳහා වූ කෙටි කාලීන ණය පමණක් නොව විවිධ ආර්ථික කටයුතු රාශියක් සඳහා දෙනු ලබන මැදි හා දිගු කාලීන ණයද ඇතුළත් වේ. කෙසේවුවද, වාර්තාවේ මෙම කොටසෙහි සැලකිල්ලට ලක් වන්නේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍ර.) යටතේ බැංකු විසින් වී සහ අනෙකුත් ආහාර භෝග වගාව සඳහා දෙනු ලබන ණය පමණි. විවිධ මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රම යටතේ දෙන ලද ණය පිළිබඳව සඳහන් නොවන්නේ එම ණයවලින් කොතරම් ප්‍රමාණයක් ග්‍රාමීය අංශය සඳහා දී තිබේද යන්න නිශ්චය කිරීමට අවශ්‍ය දත්ත විරාශිකරණයෙහිදී ඇතිවන දුෂ්කරතාවයන් නිසාය. මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රමයන් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ II වන කොටසෙහි දැක්වේ.

අදාල බැංකු ශාඛා කළමනාකරුගේ අභිමතය පරිදි, වෙනත් ගොවීන් දෙදෙනෙකුගේ ඇපවීමකින් තොරව ණය ගැනුම්කරුවනට අදාල බැංකු මගින් සැපයීමට හැකිවන පරිදි 1987 දී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය සංශෝධනය කරන ලදී. තවද, මුලදී එක් වගා කන්නයක් සඳහා දෙන ලද ණයවලට පමණක් සීමා කර තිබූ මෙම ක්‍රමය යටතේ කලින් නොගෙවා ඇති ණය ප්‍රතිලේඛනගත කිරීම 1987 දී කන්න දෙකම හසුවන පරිදි ව්‍යාප්ත කරන ලදී. එමෙන්ම, මහ බැංකුව විසින් ශ්‍රී ලංකා වාණිජ බැංකුවද මෙම ක්‍රමයට සහභාගිවන බැංකුවක් වශයෙන් පිළිගන්නා ලදී. න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමයට සහභාගිවීම සඳහා මහ බැංකුව වෙත ලියාපදිංචිවී සිටි සකසුරුවම් හා ණයදෙන සමුපකාර සමිති සංඛ්‍යාව 1986 දී 22 සිට 1987 දී 29 දක්වා වැඩි විය. එසේ වුවද, පෙරදී මෙන්ම, රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුව සහ මහජන බැංකුව මෙම ක්‍රමය යටතේ ණය සපයන ප්‍රධාන මූලයන් වශයෙන් තවදුරටත් පැවතුණි.

1.14 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි 1987 වගා වර්ෂයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ දෙන ලද රුපියල් දශ ලක්ෂ 330 ක්වූ මුළු ණය ප්‍රමාණය ඉකුත් වගා වර්ෂයේදී දෙන ලද ප්‍රමාණය හා සසඳා බලන කල, සියයට 17 ක වැඩිවීමක් පිළිබිඹු කළේය. මෙම වැඩිවීම, එක්තරා දුරකට 1986 යල කන්නය දක්වා ක්‍රියාත්මක වූ සපිරි ග්‍රාමීය ණය ක්‍රමය ප්‍රතිශෝධනය කිරීමත් සමග එයට සහභාගිවන සියළුම බැංකු විසින් වැඩියෙන් ණය දීම සඳහා දරණ ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් දැක්විය හැකිය. 1986 යල කන්නයේ සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ණය සහතික කිරීමේ ක්‍රමයද මෙම වැඩිවීම කෙරෙහි බලපාන්නට ඇත. 1987 දී ණය පරිමාවෙහි වැඩිවීම මහ කන්නයට පමණක් සීමා වූ අතර, එමගින් යල කන්නයේ වූ අඩුවීම අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සමහන් විය.

## 1.14 සංඛ්‍යා සටහන

### සපිරි ග්‍රාමීය ණය ක්‍රමය සහ නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද වගා ණය (අ)
### (1987 දෙසැම්බර් 31 වැනි දිනට තත්ත්වය)

(රුපියල් දශ ලක්ෂ)

| කාලච්ඡේදය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව* | | | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | | දෙන ලද මුළු ණය ප්‍රමාණය | | සපිරි සහ නව සපිරි ග්‍රාමීය ණය ක්‍රම යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | සුළු ආහාර භෝග | එකතුව | වී | සුළු ආහාර භෝග | එකතුව | වී | සුළු ආහාර භෝග | එකතුව | වී | සුළු ආහාර භෝග | එකතුව | වී | සුළු ආහාර භෝග | එකතුව | වී | සුළු ආහාර භෝග | |
| 1985/86 මහ .. | 44.7 | 5.2 | 49.9 | 43.2 | 11.2 | 54.4 | 12.7 | 2.9 | 15.6 | — | — | — | 0.1 | — | 0.1 | 100.7 | 19.3 | 120.0 |
| 1986 යල .. | 53.3 | 51.1 | 104.4 | 30.4 | 13.2 | 43.6 | 4.8 | 7.5 | 12.3 | 0.2 | — | 0.2 | 1.7 | — | 0.7 | 89.4 | 71.8 | 161.2 |
| 1986 වගා වර්ෂය .. | 98.0 | 56.3 | 154.3 | 73.6 | 24.4 | 98.0 | 17.5 | 10.4 | 27.9 | 0.2 | — | 0.2 | 0.8 | — | 0.8 | 190.1 | 91.1 | 281.2 |
| 1986/87 මහ .. | 94.8 | 12.2 | 107.0 | 72.4 | 22.8 | 95.2 | 12.5 | 3.1 | 15.6 | 0.3 | — | 0.3 | 2.9 | 0.1 | 3.0 | 182.9 | 38.2 | 221.1 |
| 1987 යල .. | 39.1 | 13.9 | 53.0 | 37.3 | 11.9 | 49.2 | 0.5 | 3.4 | 3.9 | — | — | — | 2.2 | 0.2 | 2.4 | 79.1 | 29.4 | 108.5 |
| 1987 වගා වර්ෂය(ආ) | 133.9 | 26.1 | 160.0 | 109.7 | 34.7 | 144.4 | 13.0 | 6.5 | 19.5 | 0.3 | — | 0.3 | 5.1 | 0.3 | 5.4 | 262.0 | 67.6 | 329.6 |

(අ) බැංකුවලින් ලබාදෙන ලද ප්‍රමාණය.
(ආ) තාවකාලික.
* සපිරි හා නව සපිරි ග්‍රාමීය ණය ක්‍රම වලට බාහිරව හැටන් නැෂනල් බැංකුව විසින් දෙන ලද ණය මුදල් ද ඇතුළුව.

මූලයන් : මහජන බැංකුව;
ලංකා බැංකුව;
සීමාසහිත හැටන් නැෂනල් බැංකුව;
ඉන්දියන් ඕවර්සීස් බැංකුව;
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු.

න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ සහභාගිවන සියලුම බැංකු විසින් 1986/87 මහ කන්නයේදී රුපියල් දශ ලක්ෂ 221 ක මුළු ණය ප්‍රමාණයක් දෙන ලද අතර, මෙය ඉකුත් වර්ෂයේ එම කන්නය තුළදී සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය හා සසඳා බලන කල සියයට 84 ක වැඩිවීමකි. මෙම කන්නයේ දෙන ලද ණයවලින් සියයට 91 ක්ම දෙන ලද්දේ ලංකා බැංකුව (සියයට 43) සහ මහජන බැංකුව (සියයට 48) විසිනි. පෙර මෙන්ම, ණයවලින් වැඩි කොටසක් (සියයට 83 ක් පමණ) දෙන ලද්දේ වී වගාව සඳහාය. මහජන බැංකුව හා ලංකා බැංකුව විසින් දෙන ලද වී වගා ණයවල සැලකියයුතු වැඩිවීම් වාර්තා වී ඇත. 1986/87 මහ කන්නයේදී මුළු වී වගා ණය ප්‍රමාණයෙන් සියයට 52 ක් මහජන බැංකුව විසින්ද, සියයට 40 ක් ලංකා බැංකුව විසින් ද දී ඇත. හැටන් නැෂනල් බැංකුව විසින් සියයට 7 ක්ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් සියයට 1 ක්ද වශයෙන් මෙම කන්නයේදී ණය සපයා ඇත.

මිරිස්, අර්තාපල් හා ළූණු ඇතුළු සුළු ආහාර භෝග සඳහා 1986/87 මහ කන්නයේදී දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 38.2 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ එම කන්නයේදී දෙන ලද ප්‍රමාණයට වඩා දෙගුණයක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මෙම ණයවලින් සියයට 60 ක් ලංකා බැංකුව විසින්ද, සියයට 32 ක් මහජන බැංකුව විසින් ද දී ඇත. සුළු ආහාර භෝග වගාව සඳහා බැංකු දෙක විසින්ම දෙන ලද ණයවල දෙගුණයක වැඩි වීමක් දක්නට ලැබුණි.

මහ කන්නයේදී දෙන ලද ණය සම්බන්ධයෙන් වාර්තා වූ සැළකිය යුතු වැඩිවීමට ප්‍රතිවිරුද්ධව 1987 යල කන්නයේදී දෙන ලද ණය ප්‍රමාණය තියුණු ලෙස පහත වැටුණි. යල කන්නයේදී දෙන ලද රුපියල් දශ ලක්ෂ 109 ක ණය ප්‍රමාණය, ඉකුත් වර්ෂයේ එම කන්නයේදී දෙන ලද ප්‍රමාණයට වඩා සියයට 33 ක පහත වැටීමක් පෙන්නුම් කළේය. මෙම පහත වැටීමට මුළුමනින්ම වාගේ හේතු වූයේ සුළු ආහාර භෝග වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය තියුණු ලෙස (සියයට 59 කින්) පහත වැටීමය. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල නොකඩවා පැවති නියං තත්ත්වය මෙම පහත වැටීමට බලපා ඇත. බැංකු අනුව සුළු අපනයන භෝග වගා ණය බෙදී ඇති ආකාරය පිළිබඳ දත්තයන්ගෙන් පෙනී යන්නේ, ඉකුත් යල කන්නයේ දෙන ලද රුපියල් දශ ලක්ෂ 51 ක ණය ප්‍රමාණය හා සසඳා බලන කල මහජන බැංකුව විසින් 1987 යල කන්නය සඳහා ලබා දී ඇත්තේ රුපියල් දශ ලක්ෂ 14 ක් බවය. ඒ අනුව, සුළු ආහාර භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයේ පහත වැටීමෙන් වැඩි කොටසකට මෙය හේතු වී ඇති බව පෙනේ.

1987 යල කන්නයේදී වී වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේ එම කන්නය හා සසඳා බලන කල සියයට 11 කින් පහත වැටී රුපියල් දශ ලක්ෂ 79.1 ක් විය. රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුව හා මහජන බැංකුව ඒකාබද්ධව මෙම කන්නයේදී දෙන ලද වී වගා ණයවලින් සියයට 97 කට දයක විය. පසුගිය වසරේ යල කන්නය හා සසඳා බලන කල, 1987 යල කන්නය සඳහා මහජන බැංකුව විසින් දෙන ලද ණය ප්‍රමාණය සියයට 27 කින් පහත වැටුණ අතර, ලංකා බැංකුව විසින් දෙන ලද ණයවල සියයට 23 ක වැඩි වීමක් වාර්තා විය.

1987 වගා වර්ෂයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් මහජන බැංකුව සියයට 49 කටද, ලංකා බැංකුව සියයට 44 කටද දයක විය. පසුගිය වගා වර්ෂයේදී මෙම බැංකු දෙකෙහි දයකත්වය පිළිවෙලින් සියයට 55 ක් හා සියයට 35 ක් විය. මෙතෙක් කෙටි කාලීන වගා ණය සැපයීමෙහි ලා වඩාත්ම වැදගත් මූලය වූයේ මහජන බැංකුව වූ නමුත්, 1987 දී එහි සාපේක්ෂ තත්ත්වය සැලකියයුතු ලෙස පහත වැටී ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව, 1987 වගා වර්ෂයේදී මෙම ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණයෙහි සියයට 47 ක වැඩි වීමක් වාර්තා වූ ලංකා බැංකුවෙහි සාපේක්ෂ තත්ත්වය සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. එනමුදු පෙරදී මෙන්ම තවමත් බැංකු අංශය විසින් සපයනු ලබන්නේ ගොවීන්ගේ ණය අවශ්‍යතාවලින් ඉතා සුළු කොටසක් පමණකි. 1986/87 මහ කන්නයේදී වී වගා ණය 34,480 ක් පමණක් දෙනු ලැබූ අතර, 1987 යල කන්නයේදී දෙන ලද ණය සංඛ්‍යාව 15,374 ක් පමණක් විය.

ඉඩම් බුක්ති ක්‍රම අනුව ණය ගැණුම් කරුවන් පිළිබඳ කරන ලද විශ්ලේෂණයකින් පෙනී යනුයේ 1986/87 මහ කන්නයේ හා 1987 යල කන්නයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ ණය ගැණුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් ජනපද වැසියන් වූ බවය. මුළු ණය ගැණුම්කරුවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස මෙම කන්න දෙකෙහි ඔවුහු පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 59 ක් වශයෙන් නියෝජනය කළහ. 1986/87 මහ කන්නයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ ණය සපයන ලද අක්කර 95,620 ක්වූ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 76 ක් ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේද, සියයට 11 ක් සුළු වාරිමාර්ග ක්‍රම යටතේ සහ සියයට 13 ක් වැසි ජලයෙන්ද වගා කරන ලදී. 1987 යල කන්නයේදීද මෙම රටාවට බෙහෙවින් සමාන වන පරිදි වගා කළ බිම් ප්‍රදේශයෙන් සියයට 79 ක් ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේද, සියයට 9 ක් සුළු වාරිමාර්ග ක්‍රම යටතේ සහ සියයට 12 ක් වැසි ජලයෙන්ද වගා කර තිබිණි.

1987 දී, ස්වාභාවික උවදුරුවලින් තම වගා කටයුතු දැඩි ලෙස හානියට පත් ණය ගැණුම්කරුවනට න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමයේ ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම් සලසනු ලැබීය. 1986/87 මහ කන්නයේදී පැහැර හරින ලද ණයවලින් ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 7 ක්වූ 1,920 ක ණය සංඛ්‍යාවක් ප්‍රතිලේඛනගත කරන ලදී. 1986 යල කන්නයේදී පැහැර හරින ලද ණය සම්බන්ධයෙන් ණය සහතික කිරීම 1987 දී ආරම්භ කෙරිණ. රුපියල් දශ ලක්ෂ 12 ක් වූ මුළු හිමිකම්පෑම්වලින් රුපියල් දශ ලක්ෂ 6 ක් හිමිකම්පෑමෙහි ප්‍රථම වාරිකය වශයෙන් ණයදෙන බැංකුවලට ගෙවනු ලැබීය. 1986/87 මහ කන්නයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය මගින් දෙන ලද ණය සම්බන්ධයෙන් ණය සහතිකවීම යටතේ මහ බැංකුවේ මුළු ආවරණය රුපියල් දශ ලක්ෂ 128 ක් වූ අතර, රැස් කරන ලද වාරික ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.3 ක් විය. 1987 යල කන්නය සඳහා අනුරූප සංඛ්‍යාවන් වූයේ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 62 ක් හා රුපියල් ලක්ෂ 6 කි.